අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය

# ඉන්දීය ඉතිහාසය
# இந்திய வரலாறு
# History of India



## ප්‍රශ්න පත්‍රය - II Question Paper – II

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

25A | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

ඉන්දීය ඉතිහාසය II (I කොටස)
இந்திய வரலாறு II (பகுதி I)
History of India II (Part I)

පැය තුනයි
மணி மூன்று ஆகுது
*Three hours*

අමතර කියවීම් කාලය – මිනිත්තු 10 යි
தல் வாசிப்பு நேரம் – 10 நிமிடங்'கள்
Additional Reading Time – 10 Minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව.1206 දක්වා

විභාග අංකය - .......................................................

## උපදෙස්-

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- ❖ **කොටසෙහි 1-40** දක්වා ප්‍රශ්න සියල්ලටම **මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස් පරිදි** පිළිතුරු සපයන්න.
- ❖ **I කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
- ❖ කොටස් **දෙකට ම** මුළු කාලය පැය **තුනකි**. පිළිතුරු ලියා අවසන් වූ පසු, **I කොටස II කොටසේ** පිළිතුරු පත්‍රය සමඟ **අමුණා භාර දෙන්න.**

### I කොටස

- අංක **01** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැළපේ**. එම **නොගැළපෙන** නාමය කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන තුළ** ලියන්න.

1 (1) හින්දුකුෂ් (2) සුලයිමාන් (3) කිර්තාර් (4) කාරකෝරම් (5) නිල්ගිරි (........)

2 (1) වික්‍රමෝර්වශී (2) දසභූමී (3) සුහෘත්ලේඛා (4) සූත්‍රාලංකාරය (5) බුද්ධ චරිතය (........)

3 (1) ධොලවීර (2) කොට්ඩිජී (3) ඉන්ද්‍රප්‍රස්ථ (4) හරප්පා (5) සුක්තජෙන්දෝර් (........)

4. (1) ඉන්ද්‍ර (2) ප්‍රජාපති (3) වරුණ (4) මරුත් (5) ඌෂා (........)

5. (1) ධෞලී (2) ගිර්නාර් (3) දිල්ලි-තෝප්‍රා (4) නාසික් (5) ලුම්බිණි (........)

6. (1) වේතාල භට්ට (2) වරහමිහිර (3) අමරසිංහ (4) ධන්වන්තරි (5) ශුද්‍රක (........)

7. (1) දේවගුප්ත (2) ධර්මපාල (3) ධ්‍රැව (4) දෙවන නාගභට (5) තුන්වන ගෝවින්ද (........)

8. (1) විශ්ණුගෝප (2) දෙවන වරගුණවර්මන් (3) නරසිංහවර්මන් (4) පළමුවන මහේන්ද්‍රවර්මන් (5) දෙවන නරසිංහවර්මන් (........)

දෙවැනි පිටුව බලන්න

9. (1) තෙළිඟු (2) මලයාලම් (3)කණ්ණඩ
(4) උර්දු (5) ද්‍රවිඩ (........)

10. (1) මුම්මුඩි චෝළ (2) පාණ්ඩ්‍ය කුලාශනී (3) කේරලාන්තක
(4) කලිකාල (5) මධුරෙයි කොණ්ඩ (........)

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාල **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11. (1) ඉන්ඩිකා - මෙගස්තිනිස්
(2) අර්ථශාස්ත්‍රය - කෞටිල්‍ය
(3) කිර්තාර්ජුන - භාරවී
(4) රඝුවංසය - කාලිදාස
(5) මහාභාරතය - වාල්මිකි (........)

12. (1) යමුනා - මථුරා
(2) කාවේරි - තංජෝර්
(3) මහානදී - ඉන්ද්‍රප්‍රස්ථ
(4) සින්දු - මොහෙනේජාදාරෝ
(5) ගංගා - කනෞජය (........)

13. (1) අල්ලකප්පය - බූලීන්
(2) පිප්ඵලි වනය - කාලාමයන්
(3) මිථිලාව - විදේහයෝ
(4) රාමග්‍රාම - කෝලියෝ
(5) සුංසුමාරගිරි - භග්ගයෝ (........)

14. (1) ශුංග - අග්නිමිත්‍ර
(2) සාතවාහන - සිමුඛ
(3) චෝල - විජයාලය
(4) රාෂ්ට්‍රකූට - දන්තිදුර්ග
(5) පාණ්ඩ්‍ය - කඩුන්ගෝන් (........)

15. (1) තංජෝරයේ බෘහදීශ්වර දේවාලය - චෝල
(2) එල්ලෝරාහි කෛලාශනාථ දේවාලය - රාෂ්ට්‍රකූට
(3) බදාමියේ විශ්ණු මහා දේවාලය - චාලුක්‍ය
(4) මහාබලිපුරම්හි වෙරළේ දේවාලය - පල්ලව
(5) බෙලූර්හි වෙණ්ණකේෂව දේවාලය - පාණ්ඩ්‍ය (........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් **X** හා **Y** තීරවල දී ඇත. **Y** තීරයේ දී ඇති නාම/ ප්‍රකාශන/දින වකවානු **X** තීරයේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. **Y** තීරය, **X** තීරය සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන තුළ** ලියන්න.

| | X | Y |
|---|---|---|
| 16. | (i) හිටරි | A - අසෝක |
| | (ii) ජුනාගාඩ් | B - ස්කන්ධ ගුප්ත |
| | (iii) මස්කි | C - පළමු රාජේන්ද්‍ර |
| | (iv) නානාඝාත් | D - රුද්‍රදාමන් |
| | (v) තිරුවාලන්ගාඩු | E - නාගනිකා |

(1) ACBDE (2) ABEDC (3) BDAEC (4) BADCE (5) CBDAE (........)

| | X | Y |
|---|---|---|
| 17. | (i) සංගෘහිත | A - පොලිස් නිලධාරි |
| | (ii) උග්‍ර | B - රජුට දඩයමේදී සහය වන නිලධාරියා |
| | (iii) භාගදූග | C - භාණ්ඩාගාරික |
| | (iv) අක්ෂවාපී | D - ආදායම් නිලධාරියා |
| | (v) ගෝවිකර්තන | E - සූදු පාලක |

(1) ACDBE (2) CADEB (3) CBADE (4) DCBAE (5) ECBAD (........)

| | X | Y |
|---|---|---|
| 18. | (i) ස්වර්ණභූමිය | A - මහාදේව හිමි |
| | (ii) කාශ්මීර - ගාන්ධාර | B - මජ්ඣිම |
| | (iii) මහිස මණ්ඩලය | C - සෝණ- උත්තර හිමිවරු |
| | (iv) තම්බපණ්ණිය | D - මහින්ද හිමි |
| | (v) හිමවත් පෙ‍ෙදස | E - මජ්ඣන්තික හිමි |

(1) CEADB (2) CABDE (3) DAEBC (4) EABDC (5) EBADC (........)

| | X | Y |
|---|---|---|
| 19. | (i) බෘහද්රථ | A - පල්ලව |
| | (ii) ගෙ‍ෟතමීපුත්‍ර ශාතකර්ණි | B - චෝල |
| | (iii) සිංහ විෂ්ණු | C - සාතවාහන |
| | (iv) දෙවන පුලකේශීන් | D - මෙ‍ෟර්ය |
| | (v) පළමුවන පරන්තක | E - චාලුක්‍ය |

(1) ACBDE (2) BAEDC (3) CBEDA (4) DCAEB (5) EDCBA (........)

| | X | Y |
|---|---|---|
| 20. | (i) කාංචිය | A - ධනංජය |
| | (ii) ඒරණ්ඩපල්ල | B - ව්‍යාඝ්‍රරාජ |
| | (iii) මහා කාන්තාරය | C - දමන |
| | (iv) කුස්තලපුරය | D - මහේන්ද්‍ර |
| | (v) කෝසලයේ | E - විෂ්ණුගෝප |

(1) ABCDE (2) BCDAE (3) CABED (4) DACBE (5) ECBAD (........)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් **එකක් අදාළ මාතෘකාවට නොගැළපේ**.එය තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

21. මගධය
(1) අගනගරය අවස්ථා තුනක දී වෙනස් විය.
(2) මගධයේ නැඟීමට අඩිතාලම දැමූ මුල් ම පාලකයා බිම්බිසාර රජතුමා ය.
(3) සොළොස්මහා ජනපද අතරින් ප්‍රබලම ජනපදය බවට පත් විය.
(4) මගධය මුල්කර ගනිමින් ඉන්දියාවේ ප්‍රථම අධිරාජයය මෞර්යයන් විසින් ගොඩ නගන ලදී.
(5) අජාසත්ත රජු පාටලීපුත්‍රය මගධයේ අගනුවර බවට පත් කරන ලදී. (........)

**22. ජෛනාගම**
(1) ජෛන මහාවීර මෙහි ශාස්තෘවරයා ය.
(2) දිගම්බර හා ශ්වේතාම්බර යනුවෙන් ජෛනාගම කණ්ඩායම් දෙකකට බෙදී තිබීම.
(3) අවිහිංසාව ජෛනයන් අනුගමනය කළ ප්‍රධාන ප්‍රතිපත්තිය යි.
(4) ක්‍රි.ව. 5 වන සියවසේ ගුජරාටයේදී ජෛන සංගායනාවක් පවත්වන ලදී.
(5) කාලාසෝක රජු ජෛනාගමේ ප්‍රධාන අනුග්‍රහයෙකු වීම. (........)

**23. කුෂාණයෝ**

(1) කණිෂ්ක කුෂාණ පෙළපතේ ආරම්භක පාලකයා ය.
(2) චීන තුර්කිස්ථාන ප්‍රදේශය ඔවුන්ගේ මුල් ම නිජබිම විය.
(3) කුෂාණයන් යු-ඒ-චී නම් එඬේර ගෝත්‍රයට අයත් පිරිසකි.
(4) ඔවුන් ඉන්දියානු සංස්කෘතිය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කිරීමට දායකත්වය ලබා දුන් පිරිසකි.
(5) සර්වලෝක ඊශ්වර, මහේෂ්වර වැනි විරුද නාම කුෂාණ පාලකයන් විසින් භාවිත කොට තිබේ. (........)

**24. හර්ෂවර්ධන රජතුමා**

(1) හර්ෂවර්ධන රජතුමා මගධරාජ යන විරුදය දැරීය.
(2) මොහු මෞකරී පෙළපතට අයත් පාලකයෙකි.
(3) හියුං සියැන් වාර්තාවේ හර්ෂවර්ධන පිළිබඳ බොහෝ තොරතුරු ඇතුලත් වේ.
(4) පංච වාර්ෂික මහා දානයක් පිරිනැමීම.
(5) කනෞජයේ හා ප්‍රයාගවල ආගමික සම්මේලන පැවැත්වීමට කටයුතු කළේය. (........)

**25. අරාබි තුර්කි ආක්‍රමණ**

(1) මදීනාවේ කාලිෆ් වංශයේ දෙවැනි ඕමාර් නාල්ෆ් රජ දවස පළමු ඉන්දියානු ආක්‍රමණය සිදු වීම.
(2) මොවුන්ගේ මුල්ම ආක්‍රමණවල අරමුණ වූයේ ඉන්දියාවේ ධනය ලබා ගැනීමයි.
(3) සෂ්නියේ මුහමුද් අවුරුදු විසිපහක් තුළ දාහත් වතාවක් ඉන්දියාව ආක්‍රමණය කොට තිබේ.
(4) ක්‍රි.ව. 10 වන සියවසේදී සබුක්තිජින් ඩෙකානය දක්වා ජයග්‍රාහීව ආක්‍රමණ මෙහෙය වීම.
(5) කුටුබ් උද්-දීන් අයිබෙක් විසින දිල්ලිය මුල් කර ගනිමින් ක්‍රි.ව.1206 දී වහල් රාජවංශය ආරම්භ කිරීම. (........)

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A) (B) (C)** හා **( D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක්** හෝ නිවැරදි ය .නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම්............................................................ 1 ද,
**(A)**සහ **(C)** පමණක් නිවැරදි නම්............................................................ 2 ද,
**(B)** සහ**( C)** පමණක් නිවැරදි නම් ............................................................ 3 ද,
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් ............................................................ 4 ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි නම්........................ 5 ද **වරහන තුළ** ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| **A** හා **B** පමණක් නිවැරදි ය. | **A** හා **C** පමණක් නිවැරදි ය. | **B** හා **C** පමණක් නිවැරදි ය. | **C** හා **D** පමණක් නිවැරදි ය. | **වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි ය. |

26. **හරප්පා සභ්‍යත්වය**

(A) වර්ග සැතපුම් විසි ලක්ෂයක් පුරා පැතිර ගිය ශිෂ්ටාචාරයකි.
(B) මෙම ශිෂ්ටාචාරයට අයත් මුල් ම සළකුණු චාල්ස් මාසන් විසින් සොයාගෙන තිබේ.
(C) මෙම ශිෂ්ටාචාරවාසීන් බාහිර ලෝකය සමග සබඳතා පැවැත් වූයේ හාරුකච්ඡ වරාය ඔස්සේ ය.
(D) මෙම ශිෂ්ටාචාරයේ බිඳ වැටීම සම්බන්ධව ප්‍රධාන වශයෙන් බලපෑවේ හූණ ආක්‍රමණය යි. (........)

**27. නන්ද පෙළපත**

(A) ආරම්භක පාලකයා මහා පද්මනන්ද රජුතුමා ය.
(B) නන්ද පෙළපතේ රජවරු 12 දෙනෙකු පාලන කටයුතු මෙහෙයවා තිබේ.
(C) ඇලෙක්සැන්ඩර් අධිරාජයා ඉන්දියාවට පැමිණෙන විට මගධය පාලනය කරනු ලැබුවේ නන්ද පෙළපතය.
(D) නන්ද රජවරු ඉතාමත් මානව හිතවාදී පාලනයක් ගෙනගිය බව සඳහන් වේ. (........)

28. **ගාන්ධාර කලාව**
(A) කුෂාණ යුගයේ දී ගාන්ධාර කලාව දියුණුවට පත් වීම.
(B) දේශිය ලක්ෂණ පිළිඹිබු කරන කලාවකි.
(C) දකුණු ඉන්දීය ආන්ධ්‍ර දේශය මුලකර ගනිමින් ගාන්ධාර කලාව වර්ධනය වී තිබේ.
(D) ගාන්ධාර කලාවේ දී බුදුරජානන් වහන්සේගේ ආධ්‍යාත්මික ලක්ෂණ පිළිඹිබු කිරීමට උත්සහ ගෙන ඇත. (........)

29. **ශකවරු**
(A) ප්‍රතිෂ්ඨානය මධ්‍යාස්ථානය කොටගෙන පාලන කටයුතු මෙහෙය වීම.
(B) මධ්‍ය ආසියානු ගෝත්‍රික පිරිසක් වීම.
(C) ක්‍රි.පූ. 1-2 සියවස්වලදී බෝලාන් දූර්ගය හරහා ඉන්දියාවට සංක්‍රමණය වීම.
(D) ඩෙකැන් ප්‍රදේශයේ විශාලත ම අධිරාජ්‍ය ගොඩනැගීම. (........)

30. **ත්‍රිකෝණ අරගලය**
(A) මෙම අරගලය හේතුවෙන් උතුරු ඉන්දියාවේ දේශපාලන බලය ස්ථාවර විය.
(B) පාල, රාෂ්ටකූඨ, පුෂ්‍යභූති යන රාජවංශ මෙම බල අරගලයට සම්බන්ධ විය.
(C) හර්ෂවර්ධන රජුගේ ඇවෑමෙන් කනෞජයේ බලය අල්ලා ගැනීම සඳහා රාජ වංශ තුනක් විසින් ගෙන යන ලද අරගලයකි.
(D) තුන්වෙනි ගෝවින්ද ත්‍රිකෝණ අරගලයට සම්බන්ධ වූ රාෂ්ට්‍රකූට පාලකයෙකි. (........)

- අංක **31** සිට **35** තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. ඉන්දියාවේ ප්‍රථම සංස්කෘත අභිලේඛනය ලෙස සැලකෙන්නේ,
(1) බ්‍රෝව් ලිපිය යි. (2) ජුනාගාඩ් ලිපිය යි. (3) අයිහෝල් ලිපිය යි.
(4) හතිගුම්ඵා ලිපිය යි. (5) සාංචි ලිපිය යි. (........)

32. **දක්ෂිණාපථපති** යන විරුදය භාවිත කළ පාලකයා කවරෙකු ද ?
(1) පළමුවන සාතකර්ණී (2) දෙවන පුලකේශීන් (3) සමුද්‍රගුප්ත
(4) ගෞතමීපුත්‍ර සාතකර්ණී (5) ස්කන්ධ වර්මන් (........)

33. පාණ්ඩ්‍යාන්ගේ අගනුවර වූයේ කුමක්ද?
(1) මධුරෙයි (2) මාන්‍යකේතය (3) බදාමිය
(4) කාංචි (5) තංජෝර් (........)

34. බ්‍රාහ්මණයන් උදෙසා ඉදි කළ පැරණිම ලෙන් වන්නේ,
(1) බරාබර් කඳු පාමුල ලෙන් (2) අජන්තා ලෙන් (3) අවුරංගාබාද් ලෙන්
(4) කාර්ලේ ලෙන් (5) උදයගිරි ලෙන් (........)

35. කොසොල් රජුගේ නැගණිය විවාහ කර ගැනීම නිසා බිම්බිසාර රජුට දායාද ලෙස හිමි වූ ජනපදය කුමක් ද?
(1) පංචාල (2) අංග (3) මල්ල
(4) කාසි (5) කුරු (........)

- අංක **36** සි **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ **දෙක** බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන**1 ,2,3,4** හා **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** | |
|---|---|---|---|
| 36 | ඉන්දියාව උතුරු හා දකුණු වශයෙන් වෙන් කළ ප්‍රධානතම භූගෝලීය සාධකය වූයේ වින්ධ්‍යා කඳු වැටිය යි. | පල්සාට් කපොල්ල වින්ධ්‍යා කඳු වැටිය හා සත්පුර කඳු වැටිය අතර පිහිටා තිබේ. | (........) |
| 37 | නාලන්දා විශ්වවිද්‍යාලය ඉන්දියාවේ බෞද්ධ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්ව තිබිණි. | වික්‍රමශීලා විශ්වවිද්‍යාලය ධර්මපාල රජුගේ අනුග්‍රහයෙන් ඉදිවිය. | (........) |
| 38 | ඉන්දු ග්‍රීකයන් මුහුදු මාර්ග භාවිත කරමින් තාම්‍රලිප්ත වරාය ඔස්සේ ඉන්දියාවට පැමිණ තිබේ. | සංස්කෘත භාෂව ඉන්දියාවට හඳුන්වා දෙනු ලැබුවේ ඉන්දු ග්‍රීකයන් ය. | (........) |
| 39 | පිහිටි ගලෙන් ලෙන් නිර්මාණය කිරීම මෞර්ය යුගයේදී ආරම්භ විය. | බරාබර්, නාගර්ජුණ හා සීතාධර්හි යන කඳුගැටවල මෞර්ය යුගයේ ඉදි කරන ලෙන් දැකගත හැකිය. | (........) |
| 40 | ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය රජු ප්‍රථම පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨත ම පාලකයා ය. | පාණ්ඩ්‍යයන් දකුණු ඉන්දියාවේ ප්‍රබල රාජ්‍යයක් ලෙස ඉස්මතු වන්නේ ක්‍රිස්තු වර්ෂ හයවන සියවස අග භාගයේදී ය. | (........) |

***

ජාතික භාෂා සහ මිනාව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
**கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
**Minister of Education, Higher Education and Vocational Education**

| 25A | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

| | |
|---|---|
| **ඉන්දීය ඉතිහාසය** | II **(II කොටස)** |
| இந்திய வரலாறு | II (பகுதி II) |
| History of India | II (Part II) |

ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

උපදෙස්-
- ❖ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- ❖ II කොටස **A,B හා C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- ❖ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ **දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) ගෝදාවරී | (ii) අජන්තා | (iii) ආරවල්ලි |
| (iv) සියල්කෝට් | (v) ඛයිබර් | (vi) ලෝතාල් |
| (vii) අලහබාද් | (viii) තංජෝර් | (ix) නිල්ගිරි |
| (x) තාම්‍රලිප්ති | (xi) මාමල්ලපුරම් | (xii) චම්බාල් |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

## B කොටස

2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන් පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

3. බ්‍රහ්මාවර්ථයේ සිට ආර්යාවර්ථයට සංක්‍රමණය වීමේ දී ආගමික චින්තනයේ ඇති වූ වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 16 යි)

4. "ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යය මෞර්යයන් විසින් ගොඩ නගන ලදී".
   (i) මෞර්ය රාජ සභාවේ සිටි ග්‍රීක තානාපතිවරයෙකු නම් කරන්න. (ලකුණු 01යි)
   (ii) මෞර්ය පරිපාලනය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රය 02ක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (iii) මෞර්ය අධිරාජ්‍යය ගොඩනැගීමෙහිලා චන්ද්‍රගුප්ත මෞර්යයන්ගේ දායකත්වය සැකෙවින් දක්වන්න. (ලකුණු04 යි)
   (iv) මෞර්ය අධිරාජයේ පරිපාලන ව්‍යුහයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) ඩෙකාන් සානුව
   (ii) පශ්චාත් වෛදික යුගයේ දේශපාලන රටාව
   (iii) අශෝක ධර්මය
   (iv) ඉන්දු ග්‍රීකයන්

   (ලකුණු 08 x 2 = 16 යි)

## C කොටස

6. "ගුප්ත යුගය ඉන්දියානු දේශපාලන ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයකි".
    (i) ගුප්ත අධිරාජයේ අගනගරය නම් කරන්න. (ලකුණු 01 යි)
    (ii) ගුප්ත පාලකයන් භාවිතා කළ විරුදනාම දෙකක් සදහන් කරන්න. (ලකුණු 02 යි)
    (iii) ගුප්ත සමයේ කලාවේ ඇති වූ දියුණුව පිළිබඳව කෙටි විවරණයක් කරන්න. (ලකුණු 04 යි)
    (iv) ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම කෙරෙහි බලපෑ සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

7. චෝලයන්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ සමාලෝචනය කරන්න. (ලකුණු 16යි)

8. පාල රාජවංශයේ වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ පරික්ෂා කරන්න.
    (i) දේශපාලන බල ව්‍යාප්තිය
    (ii) බුදු දහමට දැක් වූ දායකත්වය
    (iii) අධ්‍යාපනය හා සාහිත්‍යය ප්‍රබෝධය (ලකුණු 16 යි)

9. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
    (i) සාතවාහනයන්ගේ සංස්කෘතික කටයුතු
    (ii) කණිෂ්ක රජතුමා
    (iii) චාලුක්‍ය රාජවංශය
    (iv) ගුර්ජර ප්‍රතිහාර (ලකුණු 08 x 2 = 16 යි)

* * *

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
**கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு**
**Minister of Education, Higher Education and Vocational Education**


| 25A | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர )உயர்தர (உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

| | |
|---|---|
| **ඉන්දීය ඉතිහාසය** | **II (II කොටස)** |
| இந்திய வரலாறு | II (பகுதி II) |
| History of India | II (Part II) |

ප්‍රශ්න අංකය - ........

විභාග අංකය - ....................................



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

උපකාරක තක්සේරුව - පිළිතුරු පත්‍රය
உதவி மதிப்பீடு - விடைப்பத்திரம
Supportive Assessment - Answer sheet

සිංහල මාධ්‍යය

# ඉන්දීය ඉතිහාසය
## இலஙங்கை வரலாறு
## Indian History



**Answers Paper - II පිළිතුරු පත්‍රය - II**

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

විෂය අංකය / பாட இலக்கம்: 25A

විෂයය / பாடம்: ඉන්දීය ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 5 | 11 | 5 | 21 | 5 | 31 | 2 |
| 02 | 1 | 12 | 3 | 22 | 5 | 32 | 1 |
| 03 | 3 | 13 | 2 | 23 | 1 | 33 | 3 |
| 04 | 2 | 14 | 1 | 24 | 2 | 34 | 5 |
| 05 | 4 | 15 | 5 | 25 | 4 | 35 | 4 |
| 06 | 5 | 16 | 3 | 26 | 1 | 36 | 1 |
| 07 | 1 | 17 | 2 | 27 | 2 | 37 | 2 |
| 08 | 2 | 18 | 1 | 28 | 5 | 38 | 3 |
| 09 | 4 | 19 | 4 | 29 | 3 | 39 | 5 |
| 10 | 4 | 20 | 5 | 30 | 4 | 40 | 4 |


විශේෂ උපදෙස් -
එක් පිළිතුරකට ලකුණු 1 බැගින් - 1 x 40 = 40

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Minister of Education, Higher Education and Vocational Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு

| 25A | S | II |
|---|---|---|

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026**
**கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026**
**General Certificate of Education ( Adv. Level ) Examination - 2026**

ප්‍රශ්න අංක 01



ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Minister of Education, Higher Education and Vocational Education

25A | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2026
கல்விப் பொது தராதரப் பத்திர உயர் தரப் பரீட்சை - 2026
General Certificate of Education ( Adv. Level ) Examination - 2026

# ඉතිහාසය II

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

උපදෙස්
- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- II කොටස A,B හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමග සපයා ඇත.)

## A කොටස

1. **ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

i. ගෝදාවරී
ii. ඛයිබර්
iii. මාමල්ලපුරම්
iv. ආරවල්ලි
v. තාම්‍රලිප්ත
vi. සියල්කෝට්
vii. අජන්තා
viii. ලෝතාල්
ix. චම්බාල්
x. අලහබාද්
xi. තංජෝර්
xii. නිල්ගිරි

**(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)**

## B කොටස

2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ පැවති සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන් පරීක්ෂා කරන්න.

**ආර්ථික තත්ත්වය**
- උසස් නාගරික ලක්ෂණයන්ට සමාන්තර ව දියුණු ආර්ථිකයක් ද පැවති බව
- ආර්ථිකයේ ප්‍රධාන කොටස් 4ක් තිබූ බව
* කෘෂිකර්මාන්තය * සත්ත්ව පාලනය
* වෙළෙඳාම * විවිධ කර්මාන්ත
- කෘෂිකර්මාන්තය දියුණු ලෙස පැවති බව ධාන්‍යාගාරය හමු වීම මඟින් පැහැදිලි වන බව
- තිරිඟු සහ බාර්ලි ආදිය ද බහුල ලෙස වගා කළ බව හා වී වගාව සුළු වශයෙන් පැවති බව
- ධාන්‍ය වගාවට අමතර ව කෙසෙල් සහ දොඩම් වැනි පලතුරු වගාව ද සිදු කළ බව
- කපු රෙදි නිෂ්පාදනය සඳහා කපු වගාව සිදු කළ බව
- ඉඳි ගස් වගා කර ඇති බව

**වෙළඳාම**
- ආර්ථිකයේ ප්‍රධාන අංශයක් ලෙස වෙළෙඳාම පැවති බව
- විදේශ වෙළෙඳාම වැදගත් ම ආර්ථික ඒකකය බව
- අභ්‍යන්තර හා බාහිර වශයෙන් වෙළෙඳාම ව්‍යාප්ත ව තිබූ බව
- අභ්‍යන්තර වෙළෙඳාම ගැල් මඟින් සිදු වූ අතර බාහිර වෙළෙඳාම ගොඩබිම හා මුහුදු මාර්ග

හරහා සිදු වූ බව
- වෙළෙඳාමෙහි භාවිත කළ තරාදි, පඩි ආදිය පිළිබඳ සාධක හමු වීම
- ප්‍රධාන නගර හා සු`ළු නගර කේන්ද්‍ර කර ගනිමින් වෙළෙඳ ජාලයක් වශයෙන් පැවති බව
- ඉන්දියාවේ සිට පර්සියානු ගල්ෆ්, බහරේන් දූපත් හරහා මෙසපොතේමියාවට වැටී තිබූ ප්‍රධාන වෙළෙඳ මාර්ගය විදේශීය වෙළෙඳාමේ දී වැදගත් වූ බව
- මෙසපොතේමියාව, පර්සියානු ගල්ෆ් කලාපයේ රටවල් බහරේන්, ඉරානය හරහා වෙළෙඳ ගනුදෙනු සිදු කළ බව
- අභිලේඛනවලට අනුව හරප්පාව සහ නැන්ටි මෙල්ලූහ ප්‍රකට වාණිජ නගරයක් වූ බව
- ලෝතාල් සහ සුක්තජෙන්දෝර් විදේශීය වෙළෙඳාමේ දී ප්‍රධාන වරායවල ලෙස පැවති බව

■ **සත්ත්ව පාලනය**
- සත්ත්ව පාලනය ද ආර්ථිකයේ තවත් අංශයක් ව තිබූ බව
- සත්ත්ව පාලනයේ දී ගවයා ප්‍රධාන වූ අතර ඌරන්, කුකුළන් සහ එ`ළුවන් මස් පිණිස යොදා ගත් බව
- ගවයා කෘෂිකර්මාන්තය, ප්‍රවාහණය හා පස්ගෝරස ලබා ගැනීම සඳහා ද ප්‍රයෝජනවත් වූ බව.

■ **විවිධ කර්මාන්ත**
- හරප්පා සභ්‍යත්වයේ ආර්ථිකය ගොඩනැඟූ තවත් අංශයක් ලෙස විවිධ කර්මාන්ත හඳුනාගත හැකි බව
- බොහෝ කර්මාන්තයන් අභ්‍යන්තර වෙළෙඳාමේ දී අත්‍යවශ්‍ය භාණ්ඩ නිෂ්පාදනය කිරීම
* පේෂ කර්මාන්තය * මුතු කර්මාන්තය
* කුඹල් කර්මාන්තය * ඇත් දළ කරමාන්තය
* ලෝහ කර්මාන්තය * නැව් සහ බෝට්ටු කර්මාන්තය
* ධීවර කර්මාන්තය

■ **සමාජ සංවිධානය**
- මාතෘ මූලික සමාජයක් ලෙස පැවති බව
- පහත දැක්වෙන සමාජ කොටස් එකල නියෝජනය වූ බව
* ආගමික පන්තිය * වෙළෙනදෝ
* පාලක පන්තිය * ඉංජිනේරුවෝ
* කම්කරුවෝ * සාමාන්‍ය ජනතාව

■ පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ප්‍රධාන මානව වර්ග 4ක් විසූ බව
- මොන්ගෝලියානු
- ඇල්ෆයින්
- ප්‍රොටෝ ඔස්ට්‍රොලොයිඩ්
- මධ්‍යධරණී

■ ඉදි කර තිබූ නිවාස අනුව ධනපති හා කම්කරු යන ප්‍රධාන සමාජ පන්ති දෙකක් වූ හයි විවරණය කළ හැකි බව
සාමාන්‍ය ජනයා නිරත වූ වෘත්තිය අනුව පන්ති භේදයක් තිබෙන්නට ඇති බව

■ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂය ම ආභරණ පැලැඳි බව

■ ඇඳුම් අතර පුරුෂයන් යටිකය වැසීමට දෝතියක් වැනි දෙයක් භාවිත කළ අතර කාන්තාවන් කෙටි හෝ දිගු හෝ සායක් භාවිත කළ බව

■ විනෝදාංශ වශයෙන් දාදු ක්‍රීඩාව, මල්ලව පොර මෙන් ම නැටුම් හා ගැයුම් පැවති බව

■ කෙනෙකු මියගිය පසු ආදාහනය කිරීමේ, භූමදානය කිරීමේ හෝ අස්ථි කොටස් බරණිවල දමා තැන්පත් කිරීමේ හෝ අභිචාරයන් පැවති බව

**ආගමික විශ්වාස**

■ ශිෂ්ටාචාරයෙන් හමු වූ පුරාවිද්‍යාත්මක සාධක අනුව පහත දැක්වෙන ආගමික විශ්වාසයන් පැවතිණැයි බව විශ්වාස කෙරෙන බව
- ජගන්මාතා වන්දනය
- වෘක්ෂ වන්දනය
- ජල වන්දනය

■ **ජගන්මාතා වන්දනය**
- මේවා සැම ගෙදරක ම තබා තිබුණු බව 2000කට වඩා ටෙරාකොටා මූර්ති හමු වී තිබූ බව
- සශ්‍රීකත්වයේ හා සෞභාග්‍යයේ සංකේතයක් ලෙස වන්දනා කළ බව
- විශ්වයේ හා භූමියේ දෙවඟන ලෙස ජගන් මාතා වන්දනය කළ බව
- විවිධ ඉරියව්වලින් යුත් කාන්තා ප්‍රතිමා ජගන් මාතාව ලෙස සලකා වන්දනා කළ බව
- ඇතැම් කාන්තාවන් විසින් පාලන කාර්යයෙහි යෙදුණු බවටද ඉඟි පවතින බව

■ **වෘක්ෂ වන්දනාව**
- වෘක්ෂයට හෝ වෘක්ෂයන්ට හෝ අධිපති දෙවිවරුන් සිටිතියි විශ්වාසයෙන් යුතු ව වන්දනා කළ බව
- ඇසතු, සියඹලා, නුග යන ශාකයන්ට වන්දනා කළ බවට සාක්ෂ්‍ය වීම

■ **ජල වන්දනය**
- ශිෂ්ටාචාරයේ සියලු ම වැසියන් ජලයට ගෞරව දැක්වූ බව
- මොහෙන්ජෝදාරෝවේ ස්නානාගාරය ජල වන්දනය සඳහා යොදා ගත් බවට සාධක හමු වීම

3. බ්‍රහ්මාවර්ථයේ සිට ආර්යාවර්ථයට සංක්‍රමණය වීමේදී ආගමික චින්තනයේ ඇති වූ වෙනස්කම් පැහැදිළි කරන්න.

**ඍග් වෛදික ආගමික තත්ත්වය**
- ස්වභාව ධර්මයේ විවිධ වස්තූන්ට බලවේගයන්ට දේවත්වයක් ආරෝපණය කර වන්දනා කිරීම
- මෙලෙස දේව මණ්ඩලයක් පිළිබඳ ව සඳහන් වන හෙයින් බහු දේවවාදී ආගමික රටාවක් ඉස්මතු වීම
- මෙම දේව පිරිස් ප්‍රධාන කොටස් තුනකට බෙදා තිබීම
* ආකාශ - වරුණ, චිත්‍ර, සාවිත්‍රී, සූසාන්, සූර්ය, විෂ්ණු, ඌෂා
* අන්තරීක්ෂ - ඉන්ද්‍ර, රෞද්‍ර, වායු, පර්ජන්‍ය
* පෘථිවි - පෘථිවි, අග්නි, සෝමා, බ්‍රහස්පති, ගංගා
- මේ එක් එක් දෙවියා ස්වභාව ධර්මයේ විවිධ අංග නියෝජනය කිරීම
* ඉන්ද්‍ර - ශක්තිය, වැස්ස, මේඝ ගර්ජනා යනාදියට අධිපති
* වරුණ - ජලයට අධිපති හා ශාක හා සත්ත්ව ජීවිත පවත්වාගෙන යාමට
* අග්නි - ගින්නට අධිපති නිවසට අධිගෘහිත දෙවියා
* යම - මරණයට අධිපති
* සූර්ය - දවසට අධිපති
* පෘථිවි - පොළොවට අධිපති
* ඌෂා - උදෑසනට අධිපති
* සෝම - සඳු දෙවියා

බොහෝ දෙවිවරුන්ට පූජා කරන ජනප්‍රිය පූජා ද්‍රව්‍යයක් වූ සෝම පානය සෝම දෙවියා ලෙස ද වන්දනයට පාත්‍ර වීම
- දෙවිවරුන් බහුතරයක් යහපත් ක්‍රියාවන්ට ආරූඪ කොට තිබුණත් රුද්‍ර පමණක් අයහපතට ආරූඪ කර තිබීම
- වෛදික දෙවිවරුන් පිදීමට ඍග් වේදයේ විවිධ ස්තෝත්‍ර ගීතිකා 1028 කින් වැඩි ප්‍රමාණයක් යොදාගෙන තිබීම
- යඥය නම් වූ ආගමික කාර්යය ඉතා කුඩාවට 'ගෘහ යාග' ලෙස මෙකල ආරම්භ වීම
- පවුලේ සියල්ලන් සමඟින් ගෘහ මූලිකයා පවත්වන මෙවැනි යාගයක දී වේද ගීතිකා ගයමින් දෙවියන් වෙත කිරි හා සෝම පැළෑටියේ යුෂ පූජා කිරීම
- දෙවියන් හා මිනිසුන් සම්බන්ධ කළ අතරමැද දෙවියා ලෙස අග්නි දෙවියා වැදගත් වීම
- මෙම ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වීමෙන් පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්ත්වය සකස් වීම

පශ්චාද් වෛදික යුගයේ ආගමික තත්ත්වය

- ඍග් වෛදික ආගමික සංකල්ප තව දුරටත් විකාශනය වී බහුදේවවාදය ඒක දේවවාදයක් බවට පත් වීම
- ඍග් වෛදික පැරණි දෙවිවරුන් රාශියකගේ බලවත් බව නැති වී ඔවුන් නොවැදගත් තත්ත්වයට පත් වීම
- විෂ්ණු, ඊශ්වර, බ්‍රාහ්ම යන දෙවිවරුන් (ත්‍රිමූර්තිය) ජනප්‍රිය සංකල්පයක් බවට පත් වීම
- ඒ අතරින් ද ප්‍රජාපති හෙවත් මහා බ්‍රහ්මයා පෙරමුණට පැමිණීම
- මේ සමඟ ම ඍග් වෛදික සරල යාගය සංකීර්ණ තත්ත්වයට පත් වීම
- සරල ගෘහ යාගය මහා යාගයක් වී සතුන් පමණක් නොව මිනිසුන් ද බිලි දීම තෙක් වර්ධනය වීම
- මේ මඟින් බ්‍රාහ්මණයාගේ තත්ත්වය ඉහළ යැම නිසා ඔහු පොළොව මත හැසිරෙන දෙවියන් යන අරුත දෙන 'භූසුරු' යන නමින් හැඳින්වීම
- දෙවිවරුන් තමන් කියන ආකාරයට කටයුතු කරන සේවක පිරිසක් ලෙසට සලකා බ්‍රාහ්මණයන් ක්‍රියා කිරීම
- න්‍යාය ග්‍රන්ථවල එසේ සඳහන් වුවත් ප්‍රායෝගික ව සමාජයේ එසේ සිදු නොවූ බව වෙනත් මූලාශ්‍රයවලින් පෙනී යැම.
- ආරණ්‍යක හා උපනිෂද් වැනි යුගයක් කරා එළඹීමත් සමඟ බ්‍රාහ්මණ සංකල්පයට එරෙහි ව ශ්‍රමණ සම්ප්‍රදායක් ඉස්මතු වීම
- ඒ අනුව හිංසාකාරී යඥය පදනම් කරගත් 'කර්ම මාර්ගය' වෙනුවට (භක්තිවාදය) චින්තනයෙහි නව ප්‍රවණතාවයක් ඇති කරමින් ඥාන මාර්ගය ඉස්මතු වීම
- එහි දී බ්‍රාහ්මණ බලය පිරිහී ධ්‍යාන වඩන තවුසන්ට ප්‍රමුඛතාව ලැබීම
- ක්ෂත්‍රියයන් උපනිෂද් දර්ශනයේ පුරෝගාමීන් වීම

උපනිෂද් දර්ශනයට අනුව මෝක්ෂය ලැබීමට ඉන්ද්‍රියයන් පිනවීමෙන් මු`ඵමනින් ම වැළකිය යුතු බව සඳහන් වීම
- යාඥවල්ක්‍ය මුනිවරයා උපනිෂද්වලින් පිළිබිඹු වන ගුණ දහම්වල උත්තරීතර අවස්ථාව තම භාර්යාවට පෙන්වා දුන් බව එහි උපදේශාවලියේ සඳහන් වීම
- මිනිස් ජීවිතයට මරණින් මතු සිදු වන්නේ කුමක් ද යන දාර්ශනික ප්‍රශ්නය ගැන ද වැඩි අවධානයක් යොමු වීම
- මේ පසුබිම මඟින් පසු කාලීන ව දාර්ශනික හා ආගමික මතවාද රාශියක් ඉස්මතු වීම
- බුදුන් වහන්සේගේ දර්ශනයට පවා බලපෑවේ උපනිෂදය යි.

මෙම තොරතුරු සංසන්දනාත්මකව පැහැදිලි කිරීම වැදගත්ය.

4. ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍ය මෞර්යයන් විසින් ගොඩනගන ලදී.
   I. මෞර්ය රාජ සභාවේ සිටි ග්‍රීක තානාපතිවරයෙකු නම් කරන්න.
   මෙගස්තිනිස්/ඩයිමාකෝස්
   II. මෞර්ය පරිපාලනය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.
   අර්ථශාස්ත්‍රය/ඉන්ඩිකා/ අශෝක අභිලේඛන/අශෝකාවදානය

   III. මෞර්ය අධිරාජ්‍ය ගොඩනැගීමෙහි ලා චන්ද්‍රග=ප්ත මෞර්යයන්ගේ දායකත්වය සැකෙවින් දක්වන්න.
   * ක්‍රි.පූ. සවැනි සියවසෙන් ආරම්භ වන මගධය මුල්කොට ගත් අධිරාජ්‍ය සංකල්පය සාර්ථක කරගත් පළමු පාලකයා චන්ද්‍රගුප්තය. ක්‍රි. පූ. 324-300 අතර කාලය චන්ද්‍රගුප්ත මෞර්යගේ පාලන සමය වේ.
   * නන්ද පාලකයෙකුට දාව මුරා නම් තැනැත්තියකගේ කුසින් මොහු උපත ලද බව පුරාණ ග්‍රන්ථ වල දැක්වෙන අතර මොහු පිප්ඵලී වනයේ මෝරිය ගෝත්‍රිකයෙකු යනුවෙන්ද මතයක් පවතී.
   * සමකාලීන බුද්ධිමතෙකු වූ විෂ්ණු ගුප්ත චානක්‍යාගේ උපදෙස් මත වනගතව සේනා සංවිධානය කරමින් සිටි චන්ද්‍රගුප්ත අවසන් නන්ද පාලකයා වූ ධනනන්ද ඝාතනය කොට ක්‍රි.පූ. 321 දී මගධයේ බලය ලබාගැනීම.
   * ග්‍රීක මූලාශ්‍ර වල සන්ද්‍රා කොට්ටාස නමින් හඳුන්වා ඇති චන්ද්‍රගුප්ත, ධනනන්ද පරාජයට පත් කිරීමට ග්‍රීකයන්ගේ සහායද පැතූ බවට මතයක් පවතී.
   * චන්ද්‍රගුප්ත මෞර්ය. ඉන්දියාව ග්‍රීක පාලකයන්ගෙන් මුදාගත් පාලකයා ලෙස සැලකේ (සෙලියුකස් නිකේටර් යටත් කොට සින්ධු නදියෙන් බටහිර ප්‍රදේශය ජය ගැනීම).

* සෙලියුකස් නිකෙටර් සමග ගිවිසුමකට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රීකයන් සතුව පැවති එරියා (හේරාට්). ඇරකෝෂියා (කන්දහාර්). පරෝපනිෂදොයි (බලූකිස්තාන්). ගෙ රොෂියා (කාබුල්) යන ප්‍රදේශ චන්ද්‍රගුප්තට හිමි වීම. ග්‍රීක තානාපතිවරයෙකු වශයෙන් මෙගස්තිනිස් මෞර්ය රාජ සභාවට පත් කොට එවීම මෙන්ම සෙලියුකස් නිකෙටර්ගේ දියණිය චන්ද්‍රගුප්තට විවාහ කර දීම.
* ඩෙකැනය, තින්න වේලි, මයිසොර් වැනි ප්‍රදේශ සමගද සබඳතා පැවැත්වීම.
* කෞටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රයට අනුව චන්ද්‍රගුප්ත ගොඩබිම් හා මුහුදු වෙළඳාමට තම අධිරාජ්‍යය සම්බන්ධ කොට තිබුණා පමණක් නොව විදේශීය තානාපතිවරු නිතර පාඨලී පුත්‍ර නගරයට පැමිණ තිබේ.
* චන්ද්‍රගුප්ත අවසන් කාලයේදී මයිසෝරයේ ශ්‍රවණයෙන් බෙල්ගෝලාහි ජෛන සාදුවරයෙකු ලෙසින් වාසය කළ බව ජෛන මූලාශ්‍ර දක්වයි.

Vi මෞර්ය පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.

මෞර්ය අධිරාජ්‍යය ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යය ලෙස සැලකේ. පාටලී පුත්‍ර නගරය කේන්ද්‍ර කරගත් මෞර්ය අධිරාජ්‍යය චන්ද්‍රගුප්ත, බින්දුසාර සහ අශෝක යන පාලකයන් යටතේ වර්ධනය විය.
මෞර්ය පාලන ක්‍රමය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර කිහිපයකි. කොටිල්‍යාගේ අර්ථ ශාස්ත්‍රය. විශාකා දත්තගේ මුද්‍රා රාක්ෂය, පාතාංජලීගේ මහා භාෂ්‍යය, භද්‍රබාහුගේ කල්ප සූත්‍රය. දිව්‍යාවදානය. මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය, අශෝක සෙල්ලිපි.
මූලාශ්‍රගත තොරතුරු වලට අනුව මෞර්ය පාලන ක්‍රමය කොටස් දෙකකට වෙන් කළ හැකිය.

1. මධ්‍යම පාලනය

2. ප්‍රාදේශීය පාලනය

මධ්‍යම පාලනය

මධ්‍යම පාලනයේ ඉහළ නිලධාරියා රජුය. රාජත්වය
පාරම්පරිකව පියාගෙන් පුතාට හිමි විය. රජුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු බලතල හිමි විය. ඉන්දියාවේ ප්‍රථම වරට මහා අධිරාජ්‍යයක් හමුවන්නේ මේ කාලය තුළයි.
රජුට අසීමිත බලයක් පැවතීම. නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම, ප්‍රචාරය කිරීම, කඩ කරන අයට දඬුවම් දීම, රාජ්‍ය අනුශාසනා පැවැත්වීම, අයවැය පිළිබඳ සොයා බැලීම, විදේශ සමඟ සබඳතා පැවැත්වීම, උසස් නිලධාරීන් පත් කිරීම යන ලක්ෂණ දැකිය හැකි වීම.

රජුට සහාය වූ නිලධාරීන්
රජු ළඟට සිටි ප්‍රධානතම නිලධාරියා උපරාජ විය. රජුගේ පුතා බොහෝ විට මේ තනතුර දැරීය. උපරාජයාට පහළ නිලධාරීන් රැසක් සිටීම. අභිලේඛනවල පුරුෂ යන නමින් ඔවුන් හඳුන්වා දීම. නිලධාරීන් කොටස් 3 කි.

1. ඉහළ ගණයේ නිලධාරීන්

2. මධ්‍යම ගණයේ නිලධාරීන්

3. පහළ ගණයේ නිලධාරීන්

මෞර්ය පාලනයට උපදේශක සභාවක් ද සහාය වී ඇත. අභිලේඛනවල පරිෂා යන වචනය නමින් ද අර්ථ ශාස්ත්‍රයේ පරිෂාද් යන වචනය ද ඊට භාවිත වීම.
මේ සභාව සාමාජිකයන් 12 ට නොඅඩු හා 20 ට නොවැඩි වීම හා රජුගේ කැමැත්ත මතසාමාජික සංඛ්‍යාව තීරණය වීම.

ඉහළ ගණයේ නිලධාරීන් තිදෙනෙකි. පුරෝහිත, අග්‍රාමාත්‍ය, සේනාපති. මෞර්ය පාලනය තුළ කෞටිල්‍ය, පුරෝහිත හා අග්‍රාමාත්‍ය යන තනතුරු
අභ්‍යන්තර හා බාහිර තර්ජන වලින් රට ආරක්ෂා කිරීම. චතුරංගනී සේනාව පවත්වා ගැනීම. සේනාවට නායකත්වය දීම, සාමය පවත්වාගෙන යාම සිදු කිරීම.
මධ්‍යම ගණයේ නිලධාරීන් 6 දෙනෙකි; අන්තඃපුර පාලක. භාණ්ඩාගාරික. මුදල් අයකැමි. බලකොටුභාර නිලධාරී, නගර අධ්‍යක්ෂක, රාජ්‍ය සීමා ආරක්ෂක.

පහළ ගණයේ නිලධාරීන් වන සම්පත්, කිරුම් මිනුම්, ස්වර්ණාභරණ. කෘෂිකර්ම, ඇත්. අස් රිය, පාබල වැනි අමාත්‍යාංශ සම්බන්ධ නිලධාරීන්.

යුක්ත. දූත. ලේඛක. මහාමාත්‍ර, ප්‍රතිවේදක (පටිවේදක) වශයෙන් තවත් නිලධාරීන් කොටසක් 880.

යුක්ත (වසර 5 කට වරක් රට පුරා සංචාරය කර පර්ෂදගේ නියෝග ක්‍රියාත්මක කිරීම). ලේඛක (ලිපි ලේඛන භාර වීම), දූත (රජයේ නියෝග වෙනත් ප්‍රදේශ වලට ගෙනයාම). මහා මාත්‍ර (අශෝක රජු අභිෂේකයෙන් 14 වැනි වර්ෂයේ මේ අය පත් කළේය. මෙහි අංග 2 කි. ස්ත්‍රී අධ්‍යක්ෂක හා ධර්ම අධ්‍යක්ෂක වශයෙනි. මොවුන් විනිසුරුවන් හා අනුශාසකයන් ලෙස කටයුතු කිරීම), ප්‍රතිවේදක (චර පුරුෂයන්ගේ කටයුතු කිරීම, විවිධ වෙස් ගැනීම).
කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයේ දක්වන ආකාරයට ඇත්, අස්, රිය, පාබල, නාවුක, බඩුබාහිරාදිය ගෙන යන වශයෙන් හමුදාවන් සිටීම.

මෞර්ය අධිරාජ්‍යයේ විශාලත්වය නිසා කොටස් 5කට බෙදා පාලනය කිරීම.

පාටලී පුත්‍රය (ප්‍රාච්‍ය)

තක්ෂිලා (ගන්ධාරය)

උජ්ජේනිය (අවන්තිය)

ස්වර්ණ ගිරිය (දක්ෂිණාපතය)

කෝසල් (කාලිංගය)

ප්‍රධානියා නගරාධිපති වීම, කෞටිල්‍ය විසින් නගරාධිපති "නගරක ' නමින් හැඳින්වීම. සහායට ස්ථානික, ගෝප නිලධාරීන් සිටීම.
මෙ ගස්තීනිස්ට අනුව පාටලී පුත්‍ර නගරයේ පාලනය නිලධාරීන් 5 දෙනෙකු යටතේ වූ මණ්ඩල 6ක් මගින් ක්‍රියාත්මක විය. කර්මාන්ත, විදේශ කටයුතු, නිෂ්පාදන. ආදායම්, උපත් හා මරණ, වෙළඳ අංශ.

පහළම පාලන ඒකකය ගම විය. එහි ප්‍රධානියා ග්‍රාමිණී විය

පාලනයේ දී රාජ්‍ය ආදායම් මාර්ග පිළිබඳව ද අවධානය යොමු විය. ගණිකා වෘත්තියෙන්, සුදු පිටිවලින් හා, මත්පැන් හල් වලින් ආදායම් ලබා ගැනීම, කාග. බලි, බදු ආදායමෙන් සුභ සාධනය. රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීම, රජ ගෙදර නඩත්තුව, ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

අධිකරණය

සාධාරණ අධිකරණයක් පැවතීම. ඉහළ අධිකරණය රාජාධිකරණයයි. රජු ප්‍රධාන විය. පහළ උසාවි වල දෙන ලද තීන්දු තීරණ සාධාරණ නොවේ නම් රාජාධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමට රටවැසියාට අයිතියක් තිබුණි.

කොටිල්‍යා අර්ථ ශාස්ත්‍රයට අනුව සෑම රාෂ්ට්‍රයකටම සෑම ද්‍රෝණි මුඛයකටම අධිකරණ ශාලා තිබිය යුතු විය.

අධිකරණ ප්‍රධානියා ව්‍යවහාරික ලෙස නම් කිරීම. අධිකරණයේ පහළම උසාවිය තුළ ග්‍රාමක නම් නිලයක් පැවතීම අශෝක රජු මරණයට නියම වූවන්ට දින 3 ක පොදු සමා කාලයක් ලබා දීම ගැන සෙල් ලිපිවල සඳහන් වීම.

අධිකරණ ක්‍රියාවලිය මෙහෙය වීමේ බලය පාලකයා සතු වගකීමක් වීම.
සොරකම, කුමන්ත්‍රණ, මංපැහැරීම, මහණ බමුණන්ට නොසැලකීම දඬුවම් ලැබිය හැකි වැරදි සේ සැලකීම.
ඉහළ දඬුවම මරණීය දණ්ඩනය විය. ස්ත්‍රී - පුරුෂයන් වෙන් වෙන්ව සිරගත කිරීම.
රජුගේ උපන් දිනය. රාජ පද ප්‍රාප්තිය, පොහොය දින මුල්කරගෙන සිරකරුවන්ට සමාව දීම.

5.

**ඩෙකාන් සානුව**

බටහිර සාට්ස් කඳු වැටියත්, නැගෙනහිර සාට්ස් කඳු වැටියත් අතර පිහිටි ප්‍රදේශය ඩෙකාන් සානුව නමින් හඳුන්වයි. මෙය ඉතා විශාල බිම් පෙදෙසක් වුවත්, එහි අඩකට වැඩි ප්‍රමාණයක් නිසරු ශුෂ්ක භූමියෙන් සහ කුඩා කුඩා කඳුවැටිවලින් සමන්විත ය.
■ මෙය නැඟෙනහිර ඩෙකානය හා බටහිර ඩෙකානය ලෙස කොටස් දෙකක් යටතේ හැඳින්වේ.
■ බටහිර ඩෙකානය තුළ රාෂ්ට්‍රකූට, චාලුක්‍ය, සාතවාහන වැනි රාජවංශ වරින් වර බලය පිහිටුවා ගන්නා ආකාරය දක්නට ලැබේ.
■ නැඟෙනහිර ඩෙකානයේ තත්ත්වය මීට හාත්පසින් ම වෙනස් ය. මහානදී, ගෝදාවරී නදී, ක්‍රිෂ්ණ තුංගභද්‍ර නදී, කාවේරි නදී වැනි දකුණේ සියලුම ගංගා නැගෙනහිර තැනිතලාවේ විශාල පෙදෙසක් සරුසාර කරමින් මුහුදට ගලා බසියි. මේ නිසාම මෙම ප්‍රදේශය තුළ චාලුක්‍ය, රාෂ්ටකූට, චෝළ, පල්ලව වැනි රාජවංස ගණනාවක් ම බලය පිහිටුවා ගන්නා ආකාරය ඉතිහාසයෙන් පැහැදිලි වේ.
■ ඩෙකාන් සානුව තුළ පිහිටි වියලි, නිසරු ප්‍රදේශ, නිසරු කඳු බෑවුම් හා ගංගා නිසා ඇති වූ බෙදීම් නිසා එම ප්‍රදේශය තුළ ඒකීය දේශපාලන ආධිපත්‍යයක් බිහි නොවුණි. ඒ වෙනුවට ඉතිහාසයේ සෑම අවස්ථාවක ම කුඩා කුඩා රාජවංශ මෙම ප්‍රදේශය තුළ බලය පිහිටුවා ගන්නා ආකාරය හඳුනාගත හැකි ය.

**පශ්චාත් වෛදික යුගයේ දේශපාලන රටාව**

- ඍග් වෛදික යුගයේ පැවති සරල පාලන රටාව සංකීර්ණ තත්ත්වයට පත් වීම
- රජවරුන්ගේ බල පරාක්‍රමය වැඩි වී ඔවුන් සුවිශේෂ ආකාරයට වර්ග කරනු ලැබීම.
- ඓතරීය බ්‍රාහ්මණයේ පහත ආකාරයට රජුන් බෙදා දක්වයි
* සම්‍රාට් (අධිරාජ) - පෙරදිග රජවරු
* භෝජ - දකුණේ රජවරු
* විරාට් - උතුරේ රජවරු
* රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු
- පාලකයන්ට දේවත්වය ආරෝපණය කිරීම (රජු පෘථිවියේ දෙවියා ලෙස මනුස්මෘතියේ සඳහන් වීම
- රාජ්‍යත්වය පාරම්පරික ව උරුම වීමේ සම්ප්‍රදායයක් ඇති වීම
- අශ්වමේධ, රාජසූය වැනි මහා යාග හෝම චාරිත්‍ර හරහා පාලකයාගේ බලය ඉස්මතු කොට පෙන්වනු ලැබීම
- ග්‍රාම, විශ්, ජන යන පාලන බෙදීම් තව දුරටත් පු`ළුල් වීම
- සමිති හා සභා යන පාලන සංවිධාන තව දුරටත් පැවති නමුත් රජුට ඒවා යටත් වීම.
- රජුගේ පාලනයට සහාය දැක්වූ රත්නීන් හෙවත් රාජකර්ණඃ යනුවෙන් හැඳින්වූ නිලධාරීන් රැසක් සිටි බව ශතපථ බ්‍රාහ්මණයේ සඳහන් වීම
* පුරෝහිත - රජුගේ උපදේශක
* සේනානි - සෙන්පතිවරයා
* ග්‍රාමණී - රජුගේ බලතල ගම්වල ක්‍රියාත්මක කරන්නා

* සංග්‍රහිත්‍රී - භාණ්ඩාගාරික
* භාගදුග - ආදායම් නිලධාරී
* අක්ෂාවාෂ - සූදු පාලක
* උග්‍ර - පොලිස් නිලධාරී
ගොවිකර්තන - රජුට දඩයමේ දී සහයවන නිලධාරියා
* ක්ෂත්‍රී - ඡත්‍ර දරන්නා
* චාර - චර පුරුෂයා
- රජුට ගෙවිය යුතු බදු (බලි) සිය නිෂ්පාදනයන්ගෙන් හෝ ගවයන් ගෙන් හෝ ගෙවිය යුතු වීම
- අධිකරණයේ ප්‍රධානයා රජු බව සඳහන් වීම
- රජුගේ නියෝගයන් අනුව ග්‍රාමණීවරුන් විසින් මෙම දඬුවම් ක්‍රියාත්මක කරන ලදි.

**අශෝක ධර්මය**

- අශෝක රජු බුදු දහම වැලඳ ගැනීමෙන් පසුල සිය රට වැසියා වෙත ඔහුගේ ම දහමක් ඉදිරිපත් කරන ලදි. එය අශෝක ධර්මය ලෙස හඳුන්වනු ලැබේ. අශෝක ධර්මය යනු කුමක් ද යන්න පිළිබඳ ව විද්වතුන් අතර විවිධ මත පවතී.
* ප්ලීට් සහ බියුලර් - අශෝක ඉගැන්වූ ධර්මය දේශපාලන සහ සදාචාර ප්‍රතිපත්ති ඇතුළත් ධර්මයකි
* රාජ් කුමුද් මුඛර්ජි - අශෝක ධර්මය යනු සියලු ආගම්වල සාරය යි.
* බී.එම් බරුවා - බුදු දහමේ ලෞකික අංශයට අදාල ඉගැන්වීම් ඇතුළත් ය.
* වින්සන්ට් ස්මිත් - ඉන්දියානු සෑම ආගමකටම පොදු වූ දහමකි.
- බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ අශෝක ධර්මය බොහෝ විට ආභාසය ලබා ඇත්තේ බුදු දහමින් බව යි. සිගාලෝවාදල ව්‍යග්ඝපජ්ජල පරාභව ආදි සූත්‍ර දේශනාවලදි එන ගිහි විනය සම්බන්ධ ඉගැන්වීම් රාශියක් අශෝක ධර්මයෙහි ඇතුළත් ය.
- අශෝක අධිරාජයා සිය වැසියාගේ යහපත් පැවැත්ම සඳහා ඉදිරිපත් කළ අශෝක ධර්මය සිය රාජ්‍යයේ පිළිපැදිය යුතු විනය නීති මාලාවක් සේ ජනතාවට ඉදිරිපත් කර ඇත.
- මේවා සෙල්ලිපිවල ග්‍රීක්ල කරෝෂ්ටිල බ්‍රාහ්මී ආදි භාෂාවන්ගෙන් ලියා ඇත.
- ධර්ම මහාමාත්‍රවරුන් මෙන් ම රාජ්‍ය නිලධාරීන් මඟින් දහම සිය රාජ්‍ය පුරා ව්‍යාප්ත කර ඇත.

■ අශෝක ධර්මයේ අන්තර්ගතය
- සුශ්‍රැත (කීකරු භාවය)
දෙමාපියන්ටල වැඩිහිටියන්ටල ගුරුවරුන්ට හා උසස් කුලීනයන්ට කීකරු වීම
- ආචිති (ගරුත්වය)
සිසුන් ගුරුවරුන් කෙරෙහිත්ල ගුරුවරුන් සිය ශාස්තෲන් කෙරෙහිත්ල ගෞරවයක් දැක්වීම
- සම්ප්‍රතිපත්ති (නිරවස සංග්‍රහය)
බ්‍රාහ්මණයන්ට හා ශ්‍රමණයන්ටල ඥාතීන්ටල සේවකයන්ට හා යැපෙන්නන්ටල දිළින්දන්ට හා අසරණයන්ටල මිතුරන්ට හා සගයන්ට සංග්‍රහ කිරීම
- දාන (නිදහස)
බ්‍රාහ්මණයන්ටල ශ්‍රමණයන්ටල මිතුරන්ටල ඥාතීන්ට සහ වයෝවෘද්ධ ජනයාට දාන දීම

- ප්‍රාණානම් අනාරම්භ (සතුන් ඝාතනයෙන් වැළකීම - සියලු ම පණ ඇති සත්වයන් ඝාතනය කිරිමෙන් හා ඔවුන්ට වධ හිංසා කිරීමෙන් වැළකීම
- සාමාන්‍ය ජීවිතයේ දී පුද්ගල සම්බන්ධතාවල සාර්ථකත්වයට හේතු වන කරුණු ද අශෝක ධර්ම ප්‍රතිපත්තියේ අන්තර්ගත වේ
උදාහරණ : - සත්‍යගරුක වීමල කෘතවේදීත්වයල දැඩි කැපවීමල ත්‍යාගශීලීත්වයල ආදායම් වියදම් සමබර ව පවත්වාගෙන යාම
අශෝක ධර්මයේ අංග ඔහු පිහිටවූ ඇතැම් සෙල්ලිපි ඇසුරෙන් හඳුනාගත හැකි ය. එම සෙල්ලිපි කිහිපයක් පහත දැක්වේ.
* දිල්ලි තෝප්‍රා ටැම් ලිපිය
"මාගේ ධර්මය යනු කුමක් දැයි පැනයට පිළිතුරු ලෙස මෙය ලියා ඇත. එහි යහපත් දෑ බොහෝය. කරුණාවල දන් දීමල සත්‍යවාදී බවල පිරිසිදු බව යන ඒවා ය ...... අපා දෙපා සිවුපා බහුපා සතුන්ට ප්‍රාණ දානය හෙවත් අභයදානය දිය යුතු යල මවුපියන්ට හා වැඩිහිටියන්ට කීකරු වීමල ඥාති සංග්‍රහයල සතුන්ට දයාවල දහමෙහි හැසිරීමල ගුරුවරුන්ට වතාවත් කිරීමල මහණ බමුණන්ට

දන් දීමල අරපරෙස්සමල අල්පේච්ඡ බව සහ වෙනත් යහපත් දෑ බොහෝ ය''

හයවන ගිරි ලිපිය
''මුළු ලොවෙහි වැඩ සැලසීම මට අයත් ක්‍රියාවක් කොට සලකමි. ඊට වඩා සේවයක් මට නැත. මා විසින් කරනු ලබන යම් ව්‍යායාමයක් වේ දැයි ඒ සියල් සත්වයන්ගේ මෙලෝ පරලෝ දෙකෙහි යහපතට ඔවුන්ට මා ඇති ණයෙන් නිදහස් වීමට ය''.
* ධෞලී සුළු ගිරි ලිපිය ''සවේ මුනිසාවේ පජා මම'' - සියලු මනුෂ්‍යයෝ මාගේ දරුවෝය.

**ඉන්දු ග්‍රීකයන්**

**■ පශ්චාත් මෞර්ය අවධියට පෙර ඉන්දු ග්‍රීක සම්බන්ධතා**

■ මෞර්ය අධිරාජ්‍ය අවසාන කාලයේ සිට ග්‍රීකයන් වයඹදිග ඉන්දියාවට වරින් වර පැමිණීම.
■ මෞර්ය යුගයෙන් පසු උතුරු ඉන්දියාවේ පැවැති අස්ථාවර දේශපලන තත්ත්වය ග්‍රීකයන්ට ඉන්දියාව
ආක්‍රමණය කිරීමට සුදුසු පරිසරයක් සකස් කිරීමට හේතු වීම.
■ මිනැන්ඩර් ශුංගයන්ගේ ප්‍රදේශ ආක්‍රමණය කිරීම.
■ පර්සියානු අධිරාජ්‍යයේ ඩේරියස් රජුගෙන් පසු ඉන්දියාවට එල්ල වූ ග්‍රීක ආක්‍රමණ
උදාහරණ: ඇලෙක්සැන්ඩර් ආක්‍රමණය (ක්‍රි.පූ 4වන සියවස)ල සෙලියුකස් නිකේටර් ආක්‍රමණය
■ මෞර්ය බලය බිඳවැටීමෙන් පසු බැක්ට්‍රියානු ග්‍රීකයන් අනාරක්ෂිත වූ වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කිරීම.

ක්‍රි.පූ 250 අවසන් භාගයේ දී බැක්ට්‍රියාවේ පළමුවන ඩිමිට්‍රියස් විසින් ඉන්දියාවට ආක්‍රමණයක් එල්ල කරමින් සිය බලය (පංචාල සහ සාගල අල්ලා ගැනීමල ඉන්දු ග්‍රීකයන්ගේ ග්‍රහණයට ඉන්දියාව නතුවීමේ ආරම්භක පියවරය.
■ යුක්‍රාටිඩීස් විසින් තක්ෂිලා ප්‍රදේශය අල්ලාගනු ලැබීම.
■ දෙවන ඩිමිට්‍රියස් සාගල නැතහොත් සියල්කෝට් සිය අගනගරය කරගනිමින් වයඹදිග ඉන්දීය ප්‍රදේශවල පාලන කටයුතු මෙහෙයවීම.

මිනැන්ඩර් රජතුමා
■ ඉන්දු ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම පාලකයා වන්නේ මිනැන්ඩර් හෙවත් මිලින්ද (මිලිඳු) රජු ය.
■ ගංගා නිම්නයේ සිට බැක්ට්‍රියාවේ ඔක්සස් නදිය තෙක් හිමාලයේ සිට නර්මදා නදිය තෙක් ග්‍රීක බලය ව්‍යාප්ත කිරීම.
■ පාටලීපුත්‍රයල උජ්ජේනියල මධ්‍යම ඇෆ්ගනිස්තානිය පංජාබය සින්ධ් රාජස්ථාන් උත්තර ප්‍රදේශය ඔහුගේ පාලනය යටතේ පැවතීම.
■ අගනගරය සාගල හෙවත් වර්තමාන සියල්කෝට් වීම.
■ තක්ෂිලාල පෙෂාවෝර්ල කාබුල්ල පංජාබ් යන ප්‍රදේශ යන ප්‍රදේශය බ්‍රෝච් වරායද මිලින්ද රාජ්‍යයට අයත්
විය.
මේ රජුට අයත් කාසි සොයාගෙන තිබේ. වැඩි ම කාසි ප්‍රමාණයක්නිකුත් කළ ඉන්දීය රජු ලෙස ද ඔහු සැලකේ.
මිනැන්ඩර් රජුට අයත් කාසි
■ සියල්කෝට් ලිපියට අනුව වයඹදිගල පන්ජාබ්ල සින්ඩ්ල රාජ්පුතානාල කතියවාර් ඇතුළු විශාල ප්‍රදේශයක ආධිපත්‍යය පැවති බව.
■ මිලින්ද රජු බෞද්ධාගමටත් අනුග්‍රහ දැක්වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. මිලින්දපඤ්හ නම් කෘතියට පදනම් වී ඇත්තේ මිලින්ද රජු හා නාගසේන නම් බෞද්ධ භික්ෂුවක් අතර ඇති වූ අභිධර්මය වැනි ගැඹුරු බෞද්ධ දාර්ශනික තේමා ය.
■ බිජාපූර් අභිලේඛනයේ මොහු බුදුදහමට කළ සේවය පිළිබඳ ව සඳහන් වේ.
■ හර්මයියෝස් ග්‍රීක පෙළපතේ අවසන් පාල

# C කොටස

6.

1. ගුප්ත යුගය ඉන්දීය දේශපාලන ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයකි.
   i. ගුප්ත අධිරාජයේ අගනගරය කුමක්ද.
   පාටලීපුත්‍රය (ලකුණු 01 යි)
   ii. ගුප්ත පාලකයන් භාවිතා කළ විරුදනාම දෙකක් සඳහන්නම් කරන්න.
   වික්‍රමාදිත්‍ය, මහාරාජාධිරාජ, පරම භට්ටාරක, දේවගුප්ත, දේවශ්‍රී (ලකුණු 02 යි)
   iii. ගුප්ත රාජ්‍යය අධිරාජ්‍යයක් බවට පත් කිරීමෙහිලා සමුද්‍රගුප්ත රජුගේ දායකත්වය සැකෙවින් දක්වන්න.

සමුද්‍රගුප්තගේ යුද ප්‍රයානයේ අවස්ථා පහක් පැවති අතර මේ ගැන සඳහන් ප්‍රධාන මූලාශ්‍රය වන්නේ අලහාබාද් ප්‍රශස්තිය යි.

* ආර්යාවර්තය ජය ගැනීම:

රාජ්‍ය නවයක් යටත් කොට ගුප්ත රාජ්‍යයට ඈඳා ගැනීම. මෙහිදී රුද්‍ර දේවල මථිලල නාගදත්තල චන්ද්‍රවර්මන්ල නාගසේනල නන්දින්ල අච්‍යුතල ගණපතිනාගල බාල වර්මන් යන රජුන් පරාජය කර රාජ්‍ය ඈඳාගැනීම.

* අටවික රාජ්‍යය ජය ගැනීම:

මධ්‍යම ඉන්දියාව එනම් විද්‍යා කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශවල රාජ්‍යයන්හි රජවරුන් පරාජයට පත් කොට ඔවුන්ගේ යටත් භාවය පමණක් ලබා ගැනීම.

* දක්ෂිණාපථ රාජ්‍ය ජය ගැනීම:
  * දක්ෂිණා පථ රාජ්‍ය ජය ගැනීම:

දක්ෂිණාපථ රාජ්‍යය යටත් කොට ඒවායේ පාලකයන් අල්ලාගත් අතර ඔවුන් රජුගේ ආධිපත්‍යය පිළිගත් යටත් පාලකයන් ලෙස නැවතත් එම රාජ්‍යවල පිහිටුවීම (කෝසලයල මහා කාන්තාරයල කෞරාලයල පිෂ්ඨපුරයල කොට්ටුරය. එරණ්ඩපල්ලයල කාංචිපුරල අවමුක්තය. වෛගියල පල්ලක්කය. දේව රාෂ්ට්‍රයල කුෂ්තල පුරය).

* ප්‍රත්‍යන්ත රාජ්‍ය යටත් කිරීම:

සමතට (බෙංගාලය දක්වා)ල දවාක (ඇසෑම් ප්‍රදේශ)ල නේපාලයල කාමරූප (ඉහළ ඇසෑමට)ල කත්‍රි පුර (ජලන්දාරය).

සණ රාජ්‍ය (ගෝත්‍ර) නවයක් යටත් කරගෙන තිබේ:

මාලවල ආර්ජුනායකල යෞධෙයල මද්‍රකල ආභීරල ප්‍රාර්ජුනල සනකාභිකල කාකල බර පරක

ප්‍රත්‍යන්ත රාජ්‍ය හා සණ රාජ්‍යවල පාලකයෝ බදු ගෙවීමල ගුප්ත රාජ්‍යයේ නියෝග පිළිපැදීම හා තෑගි භෝග හා විවිධ දැකුම් සමග රජු බැහැදැක යටත් බව ප්‍රකාශ කිරීම මගින් රජුගේ ආධිපත්‍යය පිළිගෙන ඇත. (ලකුණු 04 යි)

Iv ගුප්ත අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳ වැටීම කෙරෙහි බලපෑ සාධක පරීක්ෂා කරන්න.
(ලකුණු 09 යි)

අභ්‍යන්තර සාධක

**1. ගුප්ත සමයේ අග භාගයේ දී රාජ්‍යත්වය උදෙසා ඇති වූ අභ්‍යන්තර අරගල**

පළමුවන කුමාරගුප්තගේ මිය යෑමෙන් පසු ඔහුගේ පුතුන් අතර සිහසුන වෙනුවෙන් ඇති වූ අරගල.
මේ හේතුවෙන් අධිරාජ්‍යය කුමාරවරුන් අතර කොටස් වීම.

භානු ගුප්ත නැගෙනහිර කොටස සහ වෛන්‍ය ගුප්තල බටහිර කොටස පාලනය කළ බවට සාධක වේ.

**2. විශාල අධිරාජ්‍යය පාලනය කිරීමට හා කළමනා කරණය කිරීමට අපොහොසත් වීම.**

ප්‍රාදේශීය පාලකයන් බලවත්ව නැගී ඒම සහ ස්වකීය ප්‍රාන්තවල ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම.

වලල්භි මෛත්‍රික, මාල්වාහි යශෝවර්මන්, උච්ච කල්පයෙහි පරිග්‍රාහක ආදී නායකයින් ස්වාධීනත්වය ප්‍රකාශ කිරීම හා ඔවුන් " මහාරාජ " යන විරුදාවලී පවා භාවිතා කිරීම.
ගුප්ත අධිරාජ්‍යයට ඉතිරි වූයේ මගධය පමණි.

**3. ආර්ථික පරිහානිය**

කාසිවල වටිනාකම අඩු වී යාම.

**බාහිර සාධක**

**1 නිරන්තර හූණ ආක්‍රමණ මගින් තෝරමාන හා මිහිරකුල ආදී හූණ නායකයින් ඉන්දියානු ප්‍රදේශ අල්ලා ගැනීමට දැරූ ප්‍රයත්නය.**

ඔවුන් සින්ධ්ල පංජාබ්ල මාල්වාල රාජපුතානා යන ප්‍රදේශ දිනා ගැනීම.
පසුකාලීන දුර්වල පාලකයින්ට හූණ ආක්‍රමණ වලට මුහුණදීමට ශක්තියක් නොවීම.

**2. ඩෙකෑනයේ වාකාටකවරුන්ගේ ආක්‍රමණ**

වාකාටක රාජධානියේ ව්‍යාප්තියත් සමඟ මොවුන් ගුප්තයන්ට අයත්ව තිබූ කෝසලල මේ කලා සහ ගුජරාටිය ආක්‍රමණය කිරීම.

7. චෝලයන්ගේ ආර්ථික සමාජ හා සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ සමාලෝචනය කරන්න (ලකුණු 16යි)

**සමාජ තත්ත්වය**

- චෝල සමාජය පාරම්පරික රැකියා පදනම් කරගත් කුල ක්‍රමයක් ලෙස සංවිධානය වී තිබීම
- ගොවිතැන ප්‍රධාන ජීවන වෘත්තිය වීම
- සමාජයේ ඉහළ ම ස්ථානයේ සිටි ඇතැම් බ්‍රාහ්මණයන් අධ්‍යාපනයල ආගම හා සාහිත්‍ය යන අංශවලින් බැහැර වී වෙළෙඳාමල යුද සේවය හා වෙනත් උසස් රාජ්‍ය සේවාවල නිරත වීම
- මෙකල දකුණු ඉන්දියානු කුල ක්‍රමය උතුරු ඉන්දියානු චතුර්වර්ණ ක්‍රමයට වඩා බෙහෙවින් සංකීර්ණ ස්වරූපයක් ගැනීම
- සමාජයේ නායකත්වය පුරුෂයාට ලැබුණ ද කාන්තාව ද සමාජයේ ඉහළ පිළිගැනීමටකට ලක් වූ බව ඉඩම්හිමි කාන්තාවන් ද සිටියායැයි සඳහන් වීමෙන් තහවුරු වීම
- දකුණු ඉන්දියාවේ දැසි දසුන් ක්‍රමය ක්‍රියාත්මක වීම

■ **ආර්ථික තත්ත්වය**

- ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් ක්‍රියාත්මක වීම
- වෙළෙඳ හා විවිධ භාණ්ඩ නිෂ්පාදනය කළ ශිල්ප ශ්‍රේණි පිළිබඳ ව සඳහන් වීම
 මෙකල අයියාවොලේ නම් වෙළෙඳ ශ්‍රේණිය චෝලයන්ගේ ආර්ථික කටයුතුවලට සහාය දීම
 මෙම වෙළෙඳ ශ්‍රේණිය චෝල ධජය රැගෙන ගිය බව රොමිලා ථාපර් පෙන්වා දෙයි.
- ගමේ පාලන අයිතිය ඉඩම් අයිතිය පදනම්කර හිමි වීම
- පෞද්ගලික ඉඩම් අයිතිය පිළිගැනුණු අතර ඉඩම් හිමියන්ට තමන් කැමති පරිදි තම ඉඩම් අන් සතු කළ හැකි වීම

- මේ යුගයේ මූලික වශයෙන් ත්‍රිවිධාකාර ඉඩම් භුක්ති ක්‍රමයක් ක්‍රියාත්මක වීම එනම් ගැමියන්ගේ පෞද්ගලික ඉඩම්
2. විවිධ සේවා මත පදනම් වූ ඉඩම්
3. විවිධ පූජාස්ථානවලට ප්‍රදානය කළ ඉඩම්
- කෘෂිකර්මාන්තයට ජලය සැපයීම සඳහා වාරි කටයුතු සංවිධානාත්මක ව ක්‍රියාත්මක වීම
- සත්ව පාලනයට ද ආර්ථිකයේ වැදගත් තැනක් ලැබුණු අතර ගව පාලනය ප්‍රධාන වීම
- ඈත අතීතයේ සිට ම ඉන්දියන් සාගරයේ නැඟෙනහිර හා බටහිර ප්‍රදේශ සමඟ වෙළෙඳාම පවත්වාගෙන යාම
බොහෝ නූතන විද්වතුන් චෝල අධිරාජ්‍යය සාමුද්‍රික අධිරාජ්‍යයක් ලෙස හඳුන්වා තිබීම
විදේශ ප්‍රතිපත්තියේ මූලික ඒකකය වූයේ නාවික හමුදාවයි.
- අභ්‍යන්තර මෙන් ම විදේශීය වෙළෙඳාමේ දී ද හොඳින් සංවිධානය වූ වෙළෙඳ ශ්‍රේණි ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- දේශීය අවශ්‍යතා පදනම් කරගෙන විවිධ ගෘහ කර්මාන්ත රැසක් දියුණු වීම (රෙදි විවීමල ලෝහ භාණ්ඩ සැකසීමල රන්ල රිදී හා මැණික්වලින් ආභරණ තැනීම)
- කෝවිල සංස්කෘතික මෙන් ම ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම
- තීරු බදුල උත්සව බදුල තොටුපල බදුල කඩවත් බදුල ආකර බදුල ලුණු ලේවා ආදියෙන් හා විවිධ වෘත්තීවලින් රජයට ආදායම් ලැබීම

**ආගමික තත්ත්වය**

- චෝල රජවරුන් සියලු දෙනා ම ශිව භක්තිකයන් වීම
- එහෙත් චෝල පාලනයේ මුල් අවධියේ දී අන්‍යාගම් ඉවසීම හා අන්‍යාගමික නිකායන්ට සැලකීම සිදු කිරීම
- පළමුවෙනි රාජ රාජ රජුගේ නැගණිය වූ කුන්දවා කුමරිය එක ම ස්ථානයක ශිව හා විෂ්ණු දේවාල දෙකක් හා ජෛන ආරාමයක් ඉදි කරවීම
- චෝල අධිරාජයට අයත් ඉන්දියාව තුළ හා ඉන් බාහිර ප්‍රදේශවල ශිව දේවාල ඉදි කිරීම
- පළවෙනි රාජ රාජ රජු විසින් තංජෝර්හි ඉදිකළ බෘහදේශ්වර හෙවත් රාජ රාජේශ්වර ශිව දේවාලය විශිෂ්ට නිර්මාණයක් වීම
- පළමුවෙනි රාජේන්ද්‍ර රජු ගෘහාධිකොණ්ඩ චෝලපුරම්හි ඉදිකළ ශිව දේවාලයද උසස් නිර්මාණයක් වීම
- පළමුවෙනි රාජ රාජ ලංකාවේ ගමක ආදායම තංජෝරයේ දේවාලයක නඩත්තුවට ලබා දීම
- දේවාල ඉදිකිරීමට අමතර ව ශිව - පාර්වතී පිළිම නෙලීම ද බෞද්ධ පිළිම නෙලීම ද මෙකල බහුල ව සිදු කිරීම
- ශ්‍රී විජය අධිරාජ්‍යයේ වෙළෙඳුන්ට විහාරයක් නාගපට්ටම්හි ඉදි කර ගමක් පූජා කිරීම

**භාෂාව හා සාහිත්‍යය**

- පල්ලවයන් හා පාණ්ඩ්‍යයන් යටතේ වර්ධනය වෙමින් පැවති දෙමළ සංස්කෘතික සාහිත්‍යය මෙකල තව දුරටත් වර්ධනය වීම
- කණ්ණඩල දෙමළ හා තෙළිඟු භාෂා දකුණු ඉන්දියාවේ ප්‍රධාන භාෂා ලෙස වර්ධනය වීම
- බෞද්ධ භික්ෂූන් රචනා කළ පාලි බෞද්ධ ග්‍රන්ථ කීපයක් ගැනද තොරතුරු ලැබීම
- මහාභාරතය හා රාමායණය වැනි සංස්කෘත මහා කාව්‍ය මෙකල තෙළ'ගු බසට පරිවර්තනය කිරීම
- දේවාල ආශ්‍රිත උසස් අධ්‍යාපන ආයතනවල සංස්කෘත භාෂාව භාවිත වීම
- පළමුවෙනි කුලෝත්තුංග වැනි පාලකයින් සංස්කෘත සාහිත්‍යයේ වර්ධනයට උදව් කිරීම
- ශංකරාචාර්යවරයා විසින් සංස්කෘත ධර්මග්‍රන්ථ ඉගෙනීමට ආශ්‍රම පිහටු වීම
- වෙන්කත මාධව විසින් වේදය පහදා දීමට ඍගර්ථප්‍රදීපිකාව නම් ග්‍රන්ථය රචනා කිරීම
- භාගවත් පුරාණය නම් ආගමික ග්‍රන්ථය දහවන ශතවර්ෂය මුල දී රචනා වීම
- මෙකල තිරත්තක්කදේවර්ල ජයන් කොඩ්ඩාර්ල කම්බන්ල ඔට්ටන් කුට්ටන් නම්බි ආණ්ඩර්ල ශේක්කිලර් හා නාථමුනි වැන්නන් ප්‍රසිද්ධ දෙමළ සාහිත්‍යධරයන් ලෙස වැදගත් වීම
- කාණ්ඩ එකොළහකින් යුතු ශෛව භක්ති ගීත අඩංගු ග්‍රන්ථයක් නම්බි ආණ්ඩර් කවියා විසින් රචනා කිරීම

8. පාල රාජ වංසයේ තිබෙන වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ පරික්ෂා කරන්න.
දේශපාලන බල ව්‍යාප්තිය
බුදු දහමට දැක් වූ දායකත්වය
අධ්‍යාපනය හා සාහිත්‍යය ප්‍රබෝධය

පාලවරුන්ගේ දේශපාලන කටයුතු

* සසංකගෙන් පසු කැබලි වී දුර්වලව පැවති බෙංගාලයෙහි සියවස් හතරකට වැඩි කාලයක් පැවැති රාජ්‍යයක් ගොඩනැංවීම සිදු වූයේ පාල වංශය යටතේය. පාල වංශයේ කැපී පෙනෙන පාලකයන් වූයේ ගෝපාල, ධර්මපාල, දේවපාල හා මහීපාල යන රජවරුන්ය.

* ගෝපාල බෙංගාල පාලකයා වශයෙන් තෝරාගත් බව කියැවේ. ඔහු විසින් පාලන බලය බෙංගාලය තුළ පිහිටුවා මුළු බෙංගාලයම එකම පාලනයක් යටතට ගෙන ඒම.

* ඔහුගේ ඇවෑමෙන් රජ පැමිණි ධර්මපාල පාල වංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වශයෙන් සැලකේ. සිය ආධිපත්‍යය බෙංගාලයෙන් පිටතට ව්‍යාප්ත කිරීමට ඔහු ගත් උත්සාහය ආරම්භයේදී සාර්ථක විය. ඒ මගින් ඔහු උතුරු ඉන්දියාවේ බලවත් රජකු බව පෙන්වීය.

* කනවුජයේ පාලක ඉන්ද්‍රා යුධ ඉවත්කොට තම අනුගාමිකයෙකු වූ චක්‍රායුධ පත්කිරීම. හර්ෂ සමයේ සිට කනවුජය උතුරු ඉන්දියාවේ ප්‍රධාන නගරය වී තිබිණ.

*එම පත්කිරීම ඒ වන විට උතුරු ඉන්දියාවේ සිටි රජවරුන් විසින් පිළිගනු ලැබීම.

අනතුරුව ගුර්ජර ප්‍රතිහාරයන් හා රාෂට්‍රකූටයන් සමග ඇති වූ සටන් වලින් ධර්මපාල පරාජය විය. එහෙත් ජයග්‍රාහකයන් මුහුණ දුන් ප්‍රශ්න නිසා එම ජයග්‍රහණ තහවුරු කරගැනීමට එම දෙපක්ෂයම අපොහොසත් වී ධර්මපාලගේ ආධිපත්‍යය බිඳ දැමීමට ඔවුනට නොහැකි වීම.

බෙංගාලය උතුරු ඉන්දියාවේ බලවත් රාජ්‍යය බවට පත්කළ ධර්මපාල රජු පරමේෂ්වර, පරමභට්ටාරක, මහාරාජාධිරාජ යන විරුදයන්ගෙන් හඳුනවනු ලැබීය.

* ඔහුගෙන් පසු රජ වූ දේවපාල රජු පියාගෙන් ලැබුණ රාජ්‍ය බලය වර්ධනය කළ බව පෙනේ.

වින්ධ්‍යා සහ කාම්බෝජය දක්වා ප්‍රදේශ ජය ගැනීම.

* ගුජරාට (ප්‍රතිහාර), ද්‍රවිඩ, උත්කලා (ඔරිස්සා) ඇසෑම් යන ප්‍රදේශ වලට එරෙහිව ජයග්‍රාහී සටන් මෙහෙය වීම.

* හූනයන් පරාජය කිරීම.

* දේවපාල ඇවෑමෙන් රජ පැමිණි දුර්වල පාලකයන් හය දෙනෙකුගෙන් පසු පැමිණි මහීපාල රජු බෙංගාල බලය නඟා සිටුවීමට ක්‍රියාකළ රජෙකි.

* ඔහු බෙංගාලය නැවත බලවත් රාජ්‍යයක් බවට පත් කළේය.

* බෙංගාලය ආක්‍රමණය කළ රාජෙන්ද්‍ර චෝළටල ගංගා නම් ගඟින් ඔබ්බට යා නොහැකිව පසු බසින්ට සිදු විය.

. ඔහුගේ අනුප්‍රාප්තිකයන් දුර්වල වූ හෙයින් රාජ්‍යය බිඳ වැටිණි.

* බෙංගාල රජය පිහිටවූ දෙවැන්නා ලෙස ඔහු සැලකේ.

*** පාල රජවරු බුද්ධාගමට අනුග්‍රහ දැක්වූහ (තාන්ත්‍රික ).**

* ගෝපාල රජු විසින් නාලන්දාහි විහාරයක් ඉදිකිරීම.

* වික්‍රම ශිලා සහ ඕදන්තපුර බෞද්ධ අධ්‍යාපන ආයතන (විශ්ව විද්‍යාල) පිහිටු වීම.

අටිස භික්ෂුව ටිබෙටයට ධර්මදූත මෙහෙවරක යෙදවීම.

දේවපාල සමයේදී ශෛලේන්ද්‍ර රජුගේ දූතයකු පැමිණීම.

* බෞද්ධ ආගමට අනුග්‍රහ දැක්වීම: අධ්‍යාපන ආයතන පිහිටුවීමඃ බෞද්ධ ලේඛකයකු වූ හරිබද්‍රට අනුග්‍රහ දැක්වීම: දේවපාල රජු නාලන්දා විශ්වවිද්‍යාලයට ගම් පහක් පූජා කිරීම.

* ඒ හැර කලා ශිල්ප වර්ධනයට ද අනුග්‍රහ දැක්විය.

* එහෙත් හින්දු බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දක්වමින් හින්දු දේවාල ඉදිකිරීමට ද ඔවුහු කටයුතු කළහ.

9.

**(I) සාතවාහනයන්ගේ සංස්කෘතික කටයුතු**

ඉන්දියාවේ දක්ෂිණාපථයේ සංස්කෘතික අභිවර්ධනයක් ඇති කළ සුවිශේෂ රාජවංශය
සාතවාහන ය.
- ගෘහනිර්මාණ ශිල්පය
පිහිටිගල ඇතුළට හාරා චෛත්‍යය ශාලා (බුදුගෙය) හා විහාර (ආවාස ගෙය) ඉදිකිරිම.
ඩෙකානයේ ඇති විශිෂ්ට වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරන ලෙන් කිහිපයක්
මෙම ලෙන් බොහෝ විට බෞද්ධ භික්ෂූන්ට පූජා කර ඇත. එමෙන් ම බ්‍රාහ්මණයන් හා ජෛනයන්
සඳහා ද ලෙන් පූජා කර ඇත.

විහාර (ආවාස ගෙවල්) බොහෝ විට මධ්‍ය ශාලාවකින් ද දාන ශාලාවකින් හා කුඩා කුටි
කිහිපයකින් ද සමන්විත ය. ඇතැම් ගුහාවල දානශාලාවල දන් වැළඳීම සඳහා දිග ගල් මේස නෙළා
ඇත. උල්පත්වලින් ජලය ලැබෙන ගල් පොකුණු සකස් කර තිබේ. විහාර ඇතුළට ආලෝකය
ලබා ගැනීමට ඇතු`ළු වන දොරටුවට කවු`ළුවක් තබා තිබීම.

කාර්ලේ ලෙන මොවුන්ගේ විශිෂ්ටතම නිර්මාණය වීම. මෙහි විහාර බිත්ති පවා සියුම් කැටයමින්
අලංකාර කොට ඇත. විහාරය ඇතුළට වන්නට පර්වතය හාරා කුඩා ස්තූපයක් නිමවා තිබේ.
අමරාවතී ස්තූපයට නව අංග එකතු කරමින් විශාල කිරීම රාශියක් ඉදි කිරීම
සාංචි ස්ථූපයේ වාහල්කඩ කැටයමින් නිර්මාණය කිරීම
අලුතෙන් ස්තූප රාශියක් ඉදි කිරීම
ලෙන් විහාරවල විවිධ චිත්‍ර හා මූර්ති දක්නට තිබීම
බුද්ධ රූප චිත්‍රයට නැඟීම : අජන්තා අංක 10 ලෙන් විහාරය,
නාගාර්ජුනකොණ්ඩ

- අජන්තා ලෙන්වල ඇති චිත්‍රවල බෞද්ධ කතාවස්තු හා බුද්ධ චරිතයේ ඇතැම් අවස්ථාවන්
නිරූපණය කොට තිබීම. (විජය කුමාරයා ලංකාවට පැමිණීම චිත්‍රය)
මෙම චිත්‍රවල රාජකීයයන්, කාන්තාවන්, තාපසයන්, කම්කරුවන්, යාචකයන්, ගොවියන්, විවිධ
සතුන් හා වෘක්ෂලතා ආදිය නිරූපණය කොට තිබීම.
නානාගාට්හි ලෙන්වල රජ පවුලේ සාමාජිකයන්ගේ පිළිම නෙලා තිබීම.
උදාහරණ - සිමුඛ රජුගේ පිළිරුව, පළමු සාතකර්ණී රජුගේ පිළිරුව, නාගනිකා දේවියගේ පිළිරුව,
පළමු සාතකර්ණී රජුගේ පුතුන් තිදෙනාගේ පිළිරු

**(ii) කනිෂ්ක රජතුමා**

**(1) දේශපාලන කටයුතු**

*** විදේශීය වංශයක් වූ කුෂාණ වංශය නියෝජනය කරමින් එහි තෙවන පාලකයා ලෙස කනිෂ්ක, ක්‍රි.ව. 78 සිට 101 දක්වා පෙෂාවෝරය මුල් කරගෙන පාලනය කිරීම.**

*** වයඹ දිග ඉන්දියාව, උතුරු සින්ඩ්, පංජාබය, කාශ්මීරය උත්තර ප්‍රදේශ. මාල්වා රාජ්පුථානා, බරණැස, උජ්ජේනිය යන නගරද ඔහුගේ රාජ්‍යයට අයත් වීම.**

*** නැගෙනහිර ඉන්දියාවේ පාටලී පුත්‍ර, බෙංගාලය, ඔරිස්සා, බිහාරය, නේපාලය දක්වා බලය ව්‍යාප්ත කිරීම.**

*** බටහිර ඉන්දියාවේ කතියවාරය හා භාරුකච්ඡ යන ප්‍රදේශ වල බලය ව්‍යාප්ත කිරීම.**

*** ඇෆ්ඝනිස්ථානය හා මධ්‍ය ආසියාවේ කැල්ගාර්, බෝටාන් හා යාර්බාන්ඩ් දක්වා බලය ව්‍යාප්ත කිරීම.**

*** පංචාඕ චීන සෙන්පතියාගේ ආක්‍රමණ වලට මුහුණ දීම.**

**** ඉන්දියාවෙන් ඉන්දියාවෙන් බැහැරවත් දේශපාලන බලය ව්‍යාප්ත කරමින් අධිරාජ්‍යයක් ගොඩනැගීම.**

**(ii) සංස්කෘතික වර්ධනයන්**

*** කුෂාණයෝ විදේශීය ප්‍රභවය ලැබූ රාජවංශයක් වුවද ඉන්දීය සංස්කෘතියට දැක්වූ විශාල අනුග්‍රහය.**

*** හතරවන ධර්ම සංගයනාව පැවැත්වීම (කාශ්මීරයේ කුණ්ඩලවන විහාරය) හා මධ්‍ය ආසියාතික රටවලට මහායාන දහම ව්‍යාප්ත කිරීම.**

*** බෝධි සත්ත්ව සංකල්පය ප්‍රචලිත වීම.**

***ආගමික සනශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හා ආගම් ප්‍රචාරයට උගතුන්ගේ සහාය ලබාගැනීම.**

*** සංස්කෘත භාෂාවට විශේෂ තැනක් හිමිවීම හා සංස්කෘත භාෂාවෙන් ග්‍රන්ථ රචනා වීම (අශ්වඝෝෂ, වසුබන්ධු, නාගර්ජුන, පාර්ශව, වසුමිත්‍ර).**

*** බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වීම, බෞද්ධ ගොඩනැගිලි, විහාරාරාම හා ස්ථූප ඉදිවීම.**

*** ශකරාජ වර්ෂය ඇරඹීම හා අච්චු කාසි භාවිතය ආරම්භ වීම.**

*** ගාන්ධාර, මථුරා යන කලා සම්ප්‍රදායක් පෝෂණය වීම.**

*** වෙළඳාමේ දියුණුවත් සමගම මධ්‍ය ආසියාවේ වෙළඳ නගර සමහ වාණිජ සබඳතා පැවැත්වීම හා ඉන්දීය සංස්කෘතිය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කරවීම.**

**(iii)චාලුක්‍ය රාජවංසය**

මෞර්යයන්ගෙන් අනතුරුව ඩෙකෑනයේ පැවති රාජධානි
- වාකාටකයින්ට පසු චාලුක්‍යයින් බලයට පත්වීම
- බටහිර රාජවංශය හා නැගෙනහිර රාජවංශය යනුවෙන් චාලුක්‍යයන් ප්‍රධාන වංශ දෙකක් යටතේ ව්‍යාප්ත වීම
- පසු කාලයේ දී බටහිර චාලුක්‍ය පරපුරෙන් පැවත ආ දෙවන තෛල නැමැත්තා කළ්‍යාණි ප්‍රදේශය මුල් කර කල්‍යාණි රාජධානිය ගොඩනැඟීම

**බටහිර චාලුක්‍යයෝ**
- බටහිර චාලුක්‍යයන් අවස්ථා දෙකක දී බටහිර ඩෙකානයේ බලයට පත් වීම
- වාතාපිය ( බදාමිය ) මුල් කරගෙන ගොඩනැගුණු පළමුවන චාලුක්‍ය රාජ්‍යය පළමුවන ජයසිංහ විසින් ආරම්භ කරනු ලැබීය.
- මෙම පරපුරේ දෙවෙනි පුලකේශීන් පළමුවනෙි කීර්තිවර්මන් හා දෙවෙනි පුලකේශීන් වැදගත් පාලකයන් වීම

**දෙවෙනි පුලකේශීන්**
- චාලුක්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා වීම
- අභ්‍යන්තර කැරලි මර්දනය කිරීම
- චාලුක්‍ය බල ව්‍යාප්තිය
- පල්ලවයන් සමඟ පැවති සටන්
- වනවාහිනියෙහි කදම්බා දකුණු කානර ප්‍රදේශයේ ආලුපා සහ ගංගයන් සතුව තිබුණු මයිසූර් ප්‍රදේශය ද අල්ලා ගැනීම
- උතුරු දෙසට අවධානය යොමු කර පුරි දිවයින අත්පත් කර ගැනීම
- මේ ජයග්‍රහණ නිසා අයිහෝල් සෙල්ලිපියේ " පරමේශ්වර " විරුදයෙන් මොහු හැඳින්වීම.
- අනතුරුව නැගෙනහිර ඩෙකානයේ කාලිංගය, දකුණු නේපාලය වර්තමාන ගන්ජට් විශාකපට්ටනම්, පිෂ්ටපුරය හා වෙංගිය යටත් කර ගැනීම
- බටහිර ආසියාව හා පර්සියාව සමඟ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම
- දෙවන පුලකේශීන් මරණයට පත් වීමෙන් පසු රාජ්‍ය අරාජික වීම

**වික්‍රමාදිත්‍ය ( 654 - 681 )**
- පල්ලවයන් සමඟ පැවති සටන්
- පියාගේ රාජ්‍යයේ එක්සත්බව සුරැකීම
- පාණ්ඩයින්ගේත් වික්‍රමාදිත්‍යගේත් පුත් විනයාදිත්‍ය හා මුණුබුරු විජයාදිත්‍යගේත් සහයෙන් දෙවන පුලකේශින්ගෙන් පසු අහිමි වූ ප්‍රදේශ රැසක් අත්පත් කරගැනීම

විනයාදිත්‍ය
- පල්ලවයන්, චෝලයන්, පාණ්ඩ්‍යයන්, කේරලයන්, උතුරේ හෛහයන් හා මාලවයන් ද පරාජය කිරිම

**විජයාදිත්‍ය**
- වාතාපි රාජ්‍ය පාලන කාලසීමා අතුරින් දීර්ඝතම රාජ්‍ය කාලය වීම
- සාමකාමී හා සමෘද්ධිමත් කාල සීමාවක් වීම
- පත්තදකාල්හි සංගමේශ්ර දේවාලය වැනි නිර්මාණ මඟින් මෙකල ඇති වූ ගෘහනිර්මාණ දියුණුව පෙන්නුම් කිරීම

**දෙවෙනි වික්‍රමාදිත්‍ය**
- පල්ලව අක්‍රමණ මැඩ පැවැත්වීම
- අරාබි ආක්‍රමණ මැඩ පැවැත්වීම

**දෙවෙනි කීර්තිවර්මන්**
- වාතාපියේ අවසන් බලවත් චාලුක්‍ය පාලකයා වීම
- පාණ්ඩ්‍යයන්ට එරෙහි ව සිදු කළ සටන්

**නැඟෙනහිර චාලුක්‍යයෝ**

- පළමුවෙනි විෂ්ණුවර්මන් ආරම්භක පාලකයා වීම
- අනතුරු ව නරේන්ද්‍ර මෘගරාජ බලයට පත් වීම
- වෙංගි ප්‍රදේය මුල් කොට නැඟෙනහිර චාලුක්‍ය රාජවංශය ගොඩනැඟීම
භීම
- රාෂ්ට්‍රකූටයන් සමඟ ගැටුම් ඇති කර ගැනීම
- භීමගෙන් පසු රජකම සඳහා අරගල ඇතිවීම
- දොළොස්වන සියවස මැද භාගයේ වන විට නැඟෙනහිර චාලුක්‍ය රාජධානිය චෝල බලයට යටත් වීම

**කළ්‍යාණියේ චාලුක්‍යයෝ**

- දහවෙනි සියවස අවසාන භාගයේ දී බටහිර චාලුක්‍ය පරපුරට අයත් තෛල නැමැත්තෙක් විසින් කළ්‍යාණිය මුල් කොට කළ්‍යාණි චාලුක්‍ය රාජ්‍ය ගොඩනැඟීම
- පළමුවෙනි තෛල දෙවෙනි තෛල, පළමුවෙනි සෝමේශ්වර හා වික්‍රමාදිත්‍ය පාලකයින් මෙම වංශයට අයත් වීම
- දෙළොස්වෙනි සියවසේ අවසාන භාගය වන විට කළ්‍යාණි චාලුක්‍ය රාජවංශය අභාවයට යාම

**(iv) ගුප්ත කලාව**

- ඉන්දීය ඉතිහාසයේ විශිෂ්ටතම කලා නිර්මාණ හමු වන යුගයකි
- මූර්ති කලාව,කැටයම් කලාව,සිතුවම් කලාව ලෙස වර්ගීකරණයක් දක්නට ලැබීම.
- අජන්තා, එල්ලෝරා, භාග්, සාරානාත් ආදි ස්ථාන හා දියෝගීර් දේවාලයය කලාත්මක නිර්මාණ දක්නට ලැබෙන ස්ථාන කිහිපයකි.

**මූර්ති**

- සාරානාත් ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුතු හ`ිදි පිළිමය හා මථුරාවේ හිටි බුදු පිළිමය අග්‍රගණ්‍ය මූර්ති වීම
- රාම,සීතා, අගස්ත්‍ය, විෂ්ණු, ශිව, සත්ත්ව රූප ආදි මූර්ති විශාල ප්‍රමාණයක් හමු වීම
- කාසි, බුද්ධගයා, සාරානාත් ආදි ප්‍රදේශවලින් හමුවූ බෝධිසත්ත්ව ප්‍රතිමා හා දේව ප්‍රතිමා
- උපශාන්ත බව, ස්ථායි බව, හා සියුම් බව යන ලක්ෂණවලට මුල් තැන දෙමින් මූර්ති නිමකොට තිබීම

**සිතුවම්**

- අජන්තා ලෙන් විහාර තුළ ඇති සිතුවම් මෙම යුගයේ සිතුවම් කලාවේ විශිෂ්ටත්වය පිළිබිඹු කෙරේ.
- කාලිදාසගේ කෘතිවල දැක්වෙන ලාලිත්‍යය, සෞම්‍ය භාවය, රිද්මය, ශෝභනත්වය, සුන්දරත්වය වැනි ගුණාංග මෙම චිත්‍රවල අන්තර්ගත වී තිබේ.
උදාහරණ- පද්මපාණී බෝසතුන්ගේ සිතුවම, සද්දන්ත ජාතකය, යසෝදරාව හා රාහුල කුමරු බුදුන් වහන්සේ හමු වීම දැක්වෙන සිතුවම

**කැටයම්**

- ශිව, පාර්වතී, නිරූපිත කැටයම්
- රාජ්පුතානාවේ මණ්ඩෝර්හි ක්‍රිෂ්ණ, ගෝවර්ධන, ධාරණ හා නාගගිරි දොර කැටයම්
- භිල්සා අසල උදයගිරි ලෙන්දොරෙහි නෙළා ඇති කැටයම්